DMC
SRI LANKA

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
அனர்த்த முகாமைத்துவ மத்திய நிலையம்
Disaster Management Centre

වාර්ෂික වාර්තාව 2021
ஆண்டு அறிக்கை 2021
Annual Report 2021



සුරක්ෂිත ප්‍රජාවක් සහ තිරසර සංවර්ධනයක් සහිත ශ්‍රී ලංකාවක්.
இலங்கையில் பாதுகாப்பான சமுதாயமும் நிலைபேறான அபிவிருத்தியும்.
Safer communities and sustainable development in Sri Lanka.



වාර්ෂික වාර්තාව

2021

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය



ලිපිනය

විද්‍යා මාවත,

කොළඹ 07

වෙබ් අඩවිය

www.dmc.gov.lk

විද්‍යුත් තැපෑල

info@dmc.gov.lk

හදිසි ඇමතුම්

0112136222 / 2670002 / 117

පටුන

1	හැඳින්වීම		1
	1.1	ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව	1
	1.2	ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා	2
2	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්		3
	2.1	දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ	3
	2.2	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්	3
	2.3	අන්තර්කාලීන කළමනාකරණ කමිටුව (IMC)	4
	2.4	විගණන සහ කළමනාකරණ කමිටුව (AMC)	5
	2.5	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය	6
	2.5.1	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මාණ්ඩලික නිලධාරීන්ගේ සුදුසුකම්	7
	2.6	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල විස්තරය	8
	2.6.1	2021 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් ඒකකවල සිවිල් කාර්යය මණ්ඩලය	8
	2.6.2	2021 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් ඒකකවල ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය නියෝජනය කරන කාර්යය මණ්ඩලය	9
	2.6.3	දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක	9
	2.7	2021 වර්ෂයේ ඇති වූ ආපදා තත්ත්වයන් පිළිබඳ විග්‍රහය	10
	2.7.1	ආපදාවල බලපෑම විශ්ලේෂණය	10
3	ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්		15
	3.1	ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2022-2025 වර්ෂය සඳහා සැකසීම	15
	3.2	ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලැස්ම සඳහා වූ ක්‍රමෝපායන් සැකසීම	15
	3.3	ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම (IDMP)	15
	3.4	ආපදා මධ්‍යයේ විභාග සඳහා ප්‍රවේශය - අ.පොස (සා/පෙළ) විභාගය 2021	16
	3.5	ආරක්ෂිත මධ්‍යස්ථාන කළමනාකරණය - ආරක්ෂිත මධ්‍යස්ථාන කළමනාකරුවන් සඳහා අත්පොත	17
	3.6	ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ ජාත්‍යන්තර දිනය (IDDRR)	17
	3.7	ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය (WTAD)	18
	3.8	“සෙවීමේ සහ මුදවා ගැනීමේ සිවිල් - මිලිටරි සංවාදය” පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	19
	3.9	කොවිඩ් 19 (Covid 19) වසංගතය මැඩලීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දායකත්වය	20

	3.10	වර්තමාන ආපදා තත්ත්වය හමුවේ සහන සැලසීම පිළිබඳ සාකච්ඡාව	20
	3.11	ගෝලීය උණුසුම, කාලගුණික හා දේශගුණික විපර්යාසයන් හමුවේ රටතුළ වැඩිවීමෙන් පවතින ආපදා හා ආපදා අවදානම් තත්වයන් කළමනාකරණය කිරීම	22
4	2020 වර්ෂයේදී තාක්ෂණික අංශවල ප්‍රගතිය		23
	4.1	පෙර සූදානම් හා සැලසුම් අංශය	23
	4.1.1	දිස්ත්‍රික් මට්ටමේ පෙර සූදානම් සැලසුම්	23
	4.1.2	ආපදා පෙර සූදානම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලසුම්	24
	4.1.3	ආපදා අවදානම් ප්‍රදේශවල දැන්වීමේ පුවරු සවි කිරීම	24
	4.1.4	මෝසම් පෙර සූදානම් වැඩසටහන - ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය	25
	4.1.5	පාසල් ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම	29
	4.1.6	රෝහල් පෙර සූදානම් වැඩසටහන් පැවැත්වීම	29
	4.1.7	ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන	30
	4.1.8	සුළඟේ වේගය අනුමාන කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ පෝසටර්	31
	4.1.9	සුරක්ෂිත මධ්‍යස්ථාන සඳහා ක්ෂේත්‍ර ඇඳන් බෙදාදීම	31
	4.1.10	ප්‍රගති සාමාලෝචන රැස්වීම	31
	4.1.11	වර්තමාන ආපදා තත්ත්වය හමුවේ සහන සැලසීම පිළිබඳ සාකච්ඡාව	32
	4.2	පුහුණු හා දැනුවත් කිරීමේ අංශය	32
	4.2.1	ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	33
	4.2.2	ප්‍රදර්ශන හරහා මහජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන කට්ටල නිර්මාණය කිරීම	33
	4.2.3	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳව ගෝලීය වැඩසටහන් සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම සඳහා පුවරු නිර්මාණය කිරීම	34
	4.2.4	සම්පත් මධ්‍යස්ථානය සඳහා (පුස්තකාලය) පොත් මිලදී ගැනීම	35
	4.2.5	පාර්ශවකාර ආයතන නිලධාරීන් ජාතික මට්ටමින් පුහුණු කිරීම	35
	4.2.6	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන	36
	4.2.7	පාසල් විෂය මාලාවේ විෂය භාහිර ක්‍රියාකාරකම් තුළ ආපදා අවදානම් කළමනාකරණය සඳහා අනුගත කිරීමේ ජාතික වැඩසටහන	37
	4.2.8	බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය මඟින් අඩු ආදායම්ලාභී 100,000ක් වෙත වෘත්තීය පුහුණුව ලබා දීමේ ජාතික වැඩසටහන	37
	4.2.9	මාධ්‍ය සාකච්ඡා සහ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	38
	4.2.10	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල හරහා මහජනතාවට තොරතුරු දැනුවත් කිරීම	38

	4.2.11	ජාතික සුරක්ෂිත දින වැඩසටහන	38
	4.2.12	දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	39
	4.2.13	අත් පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම	40
	4.2.14	දිස්ත්‍රික් මට්ටමේ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	41
	4.2.15	කාර්යය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන්	41
4.3	අවම කිරීම, පර්යේෂණ හා සංවර්ධන අංශය		42
	4.3.1	ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	43
	4.3.2	ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම	44
	4.3.3	අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට ආපදා අවදානම් අවම කිරීම අන්තර්ග්‍රහණය කිරීම	45
	4.3.4	ආපදා අවදානම් අවම කිරීම සඳහා ආයතනික වගකීම් හා කාර්යභාරයන් සහ ජනතාවගේ අයිතීන් පිළිබඳ ලියවිල්ලක් සැකසීම	45
	4.3.5	සමාකරන අභ්‍යාස සිදුකිරීම පිළිබඳ මාර්ගෝපදේශයක් සැකසීම	46
	4.3.6	සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීම	46
	4.3.7	ආපදා අවදානම් තක්සේරුව	46
	4.3.8	තෝරාගත් නගර 10ක් තුළ ආපදා අවදානම් තක්සේරුකරණය	47
	4.3.9	අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආපදා අවදානම් තක්සේරුකරණය සිදුකිරීම	47
	4.3.10	ආපදා අවදානම් අවම කිරීම සඳහා අධි අවදානම් සහිත ක්ෂේත්‍ර හඳුනාගනිමින් ආපදා අවදානම් තක්සේරු සිදුකිරීමේ වැඩසටහන	47
	4.3.11	ආපදා අවදානම් තක්සේරුකරණය පිළිබඳ පාර්ශව ආයතන සමඟ අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැඩමුළුව	48
	4.3.12	ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීම	48
	4.3.13	Desinventra දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම	48
	4.3.14	riskinfo අවදානම් තොරතුරු වෙබ්අඩවිය (riskinfo web potal)	49
	4.3.15	වන්දිකා ඡායාරූප භාවිතාකර ආපදාවට පාත්‍රවූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම	49
	4.3.16	දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම	49
	4.3.17	වෙනත් ආයතන සමඟ සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	49
4.4	හදිසි මෙහයුම් මධ්‍යස්ථානය		50
	4.4.1	සිදු වූ ආපදා හා සිදුකරන ලද හදිසි මෙහෙයුම් - 2021	50
	4.4.2	X-press Pearl නෞකාවෙහි ඇති වූ ගින්න මැඩපැවැත්වීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දායකත්වය	53

	4.4.3	හදිසි මෙහෙයුම් අංශය මගින් සිදු කරනු ලබන අනෙකුත් කාර්යයන්	54
	4.4.4	2021 වර්ෂය තුළ හදිසි මෙහෙයුම් අංශය මඟින් සිදු කරනු ලැබූ ව්‍යාපෘති	54
	4.4.5	දිස්ත්‍රික් හදිසි මෙහෙයුම් මැදිරි නවීකරණය කිරීම	55
	4.4.6	ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම	56
	4.4.7	සෙවුම් සහ මුදවා ගැනීමේ පාඨමාලා 5ක් පැවැත්වීම	56
	4.4.8	2021 වර්ෂයේදී හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා මිලදී ගත් උපකරණ	58
	4.4.9	පූර්ව දැනුම්දීම්	59
	4.4.10	ඇමතුම් මැදිරිය	60
	4.4.11	ත්‍රිවිධ හමුදා සහ පොලිසිය සම්බන්ධීකරණ කටයුතු	61
	4.5 මූල්‍ය අංශය		62
	4.5.1	මූල්‍ය ප්‍රගතිය (2021 දෙසැම්බර් මස 31 දිනට)	62
	4.5.2	2012 – 2021 දක්වා අවුරුදු 10ක මූල්‍ය තොරතුරු (ඇමුණුම 01)	
5	2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව		97

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධානතම ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වේ. අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම ආයතනය වෙතය.


ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව යටතේ ක්‍රියාත්මක ආයතනය ලෙස, 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතෙහි 8 වන වගන්තිය ප්‍රකාරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්ති සැලසුමෙන් ක්‍රමෝපායික මඟපෙන්වීම ලබාදීම පිළිබඳ කාර්යය, ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව වෙත පැවරී ඇති අතර, ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඒ සඳහා මඟපෙන්වීම ලබා දීම සිදු කරනු ලැබේ. ප්‍රතිචාර මත පදනම් යාන්ත්‍රණයෙන් බැහැරව ප්‍රගාමී ප්‍රවේශයක් ලබාගැනීම උදෙසා ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා යොමුවෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්පූර්ණයෙන්ම ආවරණය කරන ව්‍යසන අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා වන කාර්ය රාමුවක් බවට 2005 අංක 13 දරණ මෙම පනත පත්විය.

මෙම පනත මඟින් පිහිටුවන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වනුයේ, ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනිකුත් ප්‍රධාන ආයතන හා එක්ව සහන සහ පශ්චාත් ව්‍යසන කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අඩු කිරීමේ කටයුතු සියලුම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ආපදා ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඇත.

1.1 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව

2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් නීතිමය ප්‍රතිපාදන අනුව ව්‍යසන කළමනාරකරණය සඳහා වූ ජාතික සභාව 2005 වසරේ දී පිහිටුවන ලදි. මෙය ආපදා කළමනාකරණයේ ප්‍රධාන ස්ථානය වන අතර එය ගරු ජනාධිපතිතුමාගේ සභාපතීත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ උප සභාපතිත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ නියෝජනයක් සහිත ආයතනයකි. ආපදා කළමනාකරණ ජාතික සභාවේ අනෙකුත් සාමාජිකයන් වන්නේ පනතේ විශේෂයෙන් සඳහන් කර ඇති තෝරාගත් විෂයයන් භාරව සිටින අමාත්‍යවරු, පළාත් ප්‍රධාන අමාත්‍යවරු (ප්‍රධාන අමාත්‍යවරයාට සහභාගිවීමට නොහැකි විට එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා) සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් පස් දෙනෙකුන්ගෙන් යුතු කණ්ඩායමකි. (සටහන 1.1)

ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවේ සංයුතිය



සටහන 1.1: ජාතික සභාවේ සංයුතිය

1.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා

2005 අංක 13 දරණ පනත අනුව ආපදා කළමනාකරණය යටතට ගැනෙන උවදුරු වන්නේ,

- නායයෑම්
- සුළි සුළඟ
- ගං වතුර
- නියඟය
- කාර්මික ආපදා
- සුනාමි
- භූමි කම්පා
- ගුවන් උවදුරු
- සමුද්‍රීය උපද්‍රවයන්
- ගිනි
- ටොනාඩෝ, අකුණු ගැසීම් සහ දැඩි ගිගුරුම් සහිත කුණාටු
- වසංගත තත්ත්වයන්
- පිපිරීම්
- ගුවන් ප්‍රහාර
- සිවිල් හෝ අභ්‍යන්තර අරගල
- රසායනික අනතුරු
- විකිරණ සම්බන්ධ හදිසි අවස්ථා
- අභ්‍යන්තර සහ මුහුදු කාන්දුවීම් ඇතුළත් තෙල් කාන්දු වීම්
- න්‍යෂ්ටික ආපදා
- නාගරික සහ වනාන්තර ගිනිගැනීම්
- වෙරළ බාදනය

2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති ජාතික වගකීම වන්නේ, ඇතිවිය හැකි ඕනෑම ආපදා තත්වයක් කාර්යක්ෂමව කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කරමින් සුරක්ෂිත ප්‍රජාවක් ඇති කිරීමයි. ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් අංශ හතකින් සමන්විතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාවලිය සකස් වී ඇත.
ඒ අනුව එහි ප්‍රධාන අංශ පහත සඳහන් වේ.

1. ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පෙර සූදානම් හා සැලසුම් අංශය
3. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය
4. හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ අංශය
5. මානව සම්පත් හා පරිපාලන අංශය
6. මූල්‍ය අංශය
7. අභ්‍යන්තර විගණන අංශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ජාතික වගකීම දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සෑම දිස්ත්‍රික්කයක් තුළම ස්ථාපිත කර ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රටතුළ ක්‍රියාත්මක කෙරේ.

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ

<u>දැක්ම</u>

සුරක්ෂිත ප්‍රජාවක් සහ තිරසාර සංවර්ධනයක්.

<u>මෙහෙවර</u>

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන හදිසි ආපදා තත්ත්වයන් ක්‍රමානුකූලව කළමනාකරණය තුළින් ප්‍රජාව තුළත් පොදුවේ පවුල් ඒකක තුළත් සුරක්ෂිත වූ සංස්කෘතියක් ගොඩනැගීම.

<u>අභිමතාර්ථ</u>

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී යනාදී දීප ව්‍යාප්ත පරිපාලන ව්‍යුහයන් තුළින් පහත සඳහන් කාර්යයන් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ප්‍රධාන වගකීම්,

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම.
- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තත්ත්ව තක්සේරු කිරීම.
- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම.

- පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහායවීම ඇතුළුව ව්‍යසන සඳහා පෙර සූදානම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් ලබාදීම හා ප්‍රචාරණය.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ සෙවීම් සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.
- සහනාධාර බෙදාදීම ඇතුළු පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවම කිරීම් ව්‍යුහාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- ආපදා අවදානම් අවම කිරීම සඳහා සංවර්ධන ප්‍රවාහයට ආපදා අවදානම් අන්තර්ගත කිරීම.
- දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- ව්‍යසන අවදානම් අඩුකිරීමේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, පුද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන දේශීය සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදාළ ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ආපදා අවම කිරීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යසනවලින් පසු යථා තත්ත්වයට පත්වීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම, ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2.3 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව (IMC)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණය හා මූල්‍ය පාලනය අධීක්ෂණය හා මෙහෙයවීම සම්බන්ධව තීරණ ගන්නා වූ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය අන්තර්කාලීන කළමනාකරණ කමිටුව නම් වේ. එය ආපදා කළමනාකරණ විෂයභාර කැබිනට් අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අතර 2021 වර්ෂය තුළ දී රැස්වීම්වාර 4ක් පවත්වා ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශ ලේකම් ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී යුඑස්පී එන්ඩීසී පීඑස්සී	-	සභාපති
ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ආර්.එම්.පී.එස්.රත්නායක මහතා, අතිරේක ලේකම්	-	සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ආචාර්ය ආසිරි කරුණාවර්ධන මහතා	-	සාමාජික
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ නියෝජිතයෙක් එම්.ඒ.එස්.මහේෂී මහත්මිය, අතිරේක ලේකම්	-	සාමාජික
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ නියෝජිතයෙක් ඒ.එන්.අමරතුංග මහත්මිය, අධ්‍යක්ෂ	-	සාමාජික
ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී එච්.යු.ආර්.ෆොන්සේකා මහතා	-	සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මේජර් ජෙනරාල් එස්.රණසිංහ (විශ්‍රාමික) ආර්ඩබ්පී ආර්එස්පී එම්එස්සී එන්ඩීයු පීඑස්සී	-	ලේකම්

2.4 විගණන සහ කළමනාකරණ කමිටුව (AMC)

2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත දැක්වේ.

අනු අංකය	නම, තනතුර හා ආයතනය	කමිටුවේ තනතුර
01	ඒ.එන්. අමරතුංග මිය - අධ්‍යක්ෂ, භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය.	සභාපති
02	ආර්.එම්.පී.එස්. රත්නායක මහතා - අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති), ආරක්ෂක අමාත්‍යාංශය.	සාමාජික
03	එච්.යූ.ආර්. ෆොන්සේකා මහතා - ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අංශය	සාමාජික
04	කේ.ඒ.එස්. මහේෂි මහත්මිය - අතිරේක ලේකම් (සංවර්ධන), පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය.	සාමාජික
05	එල්.බී.ජී. සඳමාලි මහත්මිය - විගණන අධිකාරි (වැ.බ.), ජාතික විගණන කාර්යාලය.	නිරීක්ෂක
06	ආර්.ඒ.එන්.ඩී. රණතුංග මහත්මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක,ආපදා කළමනාකරණ අංශය.	නිරීක්ෂක
07	මේජර් ජෙනරාල් එස්. රණසිංහ මහතා (විශ්‍රාමික) - අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.	ලේකම්
08	ජේ.එච්.පී. ජයලත් මහතා - අභ්‍යන්තර විගණක, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.	කැඳවුම්කරු

ජාතික විගණන කාර්යාලයෙන් හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශයෙන් නිකුත් කර තිබූ විගණන විමසුම්වලින් මතුකර ඇති නිරීක්ෂණ පිළිබඳව මෙහිදී සාකච්ඡාවට භාජනය කර ඇත. විශේෂයෙන්ම අභ්‍යන්තර විගණක විසින් 2021 වර්ෂය සඳහා සකස් කර තිබූ අවදානම් පදනම් කරගත් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය, පාලන ක්‍රියාවලිය හා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අදාළව මතුකර තිබූ විගණන නිරීක්ෂණ මෙම කමිටුවේ දී වැඩි දුරටත් විශ්ලේෂණය කරමින් ආයතනයේ අරමුණු ලඟාකර ගැනීම සඳහා ඉවහල් වන පරදි විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ ලබා දී ඇත.


ඒ අනුව මුදල් රෙගුලාසි 133 හා 134 දැක්වෙන කාර්යභාරයන්, කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛණවල දැක්වෙන උපදෙස්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හා ජාතික විගණන පනතේ නියමයන්ට අනුව විගණන හා කළමනාකරණ කමිටුවේ දී කරුණු සාකච්ඡා කර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අරමුණු ලඟාකර ගැනීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකාරිත්වය වෙත අවශ්‍ය මඟපෙන්වීම් සිදුකර ඇත. එමෙන්ම විගණන විමසුම් හා වාර්තාවලින් මතුකරන නිරීක්ෂණ හා විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ සඳහා මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන නිවැරදි කරගැනීම්වල ප්‍රමාණාත්මක හා

ගුණාත්මකභාවය පිළිබඳව ද මෙහිදී වැඩිදුරටත් කරුණු සොයා බලා ඇත. පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුව ද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2021 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් (02) පවත්වා අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත්ව හා නිවැරදිව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් කළමනාකාරිත්වය වෙත ලබා දී ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවට අදාළව ශ්‍රී ලංකාවේ සම්පත්වලට මූලිකත්වය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් භාර ගන්නා ලද ව්‍යාපෘති, වැඩසටහන් හා කාර්යභාරයන්වල පූර්ව නිශ්චය කර ගත් අරමුණු ලභා කර ගැනීමේ පරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂමව භාවිතා කර ඇති බවට සහතික වීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සෑම කළමනාකරණ අංශයක් ම සමාලෝචනය කිරීම සිදු කිරීම සහ එකී ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද අරමුදල් වියදම් කිරීම සඳහා, අවසර ලත් කාල සීමාව තුළ එකී පරමාර්ථ සැබෑවටම අත්කර ගෙන තිබේ ද යන්න සහ නිම කළ ව්‍යාපෘති හෝ වැඩ සටහන්, සැලසුම්වලින් අපේක්ෂිත වූ පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න නිර්ණය කිරීම සිදු කිරීම පැවරී ඇති අතර එම කාර්යයන් ඉදිරි වර්ෂවලදී ද මනාව සිදු කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සැලසුම් කර ඇත.

2.5 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

සටහන 2.1හි දක්වා ඇති පරිදි ආපදා කළමනාරණ මධ්‍යස්ථානය විසින් ඉටුකරනු ලබන විවිධ කාර්යයන් හා වැඩසටහන් සැලකිල්ලට ගනිමින් මෙම ආයතනික ව්‍යුහය සකස් කර ඇත.



සටහන 2.1: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

2.5.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මාණ්ඩලික නිලධාරීන්ගේ සුදුසුකම්

වගුව 2.1: මාණ්ඩලික නිලධාරීන්ගේ සුදුසුකම්

නම	තනතුර	අධ්‍යාපනික සුදුසුකම්
මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ ආර්ඩබ්පි ආර්එස්පි එම්එස්සි එන්ඩියු පිඑස්සි	අධ්‍යක්ෂ ජනරාල්	විද්‍යාපති (සංග්‍රාම අධ්‍යනය) (පකිස්ථානය) විද්‍යාවේදී (හමුදාමය හා දේශපාලන මූලෝපාය) (චීනය) විද්‍යාවේදී (සංග්‍රාම අධ්‍යනය) (පකිස්ථානය) ඩිප්ලෝමාව (පිරිස් කළමනාකරණය)
රොහාන් ප්‍රියන්ත සමරක්කොඩි	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	විද්‍යාපති (විශ්ලේශණ රසායන විද්‍යාව) විද්‍යාවේදී (විශේෂ) (රසායන විද්‍යාව) C.Chem. M.I.Chem. C
දිසානායක මුදියන්සේලාගේ සුගතදාස	අධ්‍යක්ෂ (දැනුවත් කිරීම්)	ශාස්ත්‍රපති (සමාජ විද්‍යාව) ශාස්ත්‍රපති (අපරාධ විද්‍යාව) පශ්චාත් ඩිප්ලෝමාව (ජාත්‍යන්තර කටයුතු) ශාස්ත්‍රවේදී (විශේෂ) (සමාජ විද්‍යාව සහ අපරාධ විද්‍යාව)
ජයවීර මුදියන්සේලාගේ සුනිල් ජයවීර	අධ්‍යක්ෂ (පෙර සූදානම්)	විද්‍යාපති (ග්‍රාමීය හා නගර සැලසුම්) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ව්‍යවහාරික සමාජ විද්‍යාව) විද්‍යාවේදී (විශේෂ) (දේපල කළමනාකරණ හා තක්සේරු) වරලත් නගර නිර්මාණ ශිල්පී
අමරසිංහ ආරච්චිලාගේ අනෝජා කුමාරි සෙනෙවිරත්න	අධ්‍යක්ෂ (අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන)	විද්‍යාපති (භූ ගර්භ දත්ත විද්‍යාව හා භූ සමීක්ෂණ) (නෙදර්ලන්තය) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (මානව සම්පත් කළමනාකරණය) විද්‍යාවේදී (විශේෂ) (භූ ගර්භ විද්‍යා) ඩිප්ලෝමාව (ජාත්‍යන්තර සම්බන්ධතා) වරලත් ඉංජිනේරු ආයතනය (එ.රා.) (කොටස I සහ II)
කිරිපිටිය අබේසිංහගේ නිශාන්ත	අධ්‍යක්ෂ (මුදල්)	විද්‍යාපති (වෘත්තිය ගිණුම්කරණය) විද්‍යාවේදී (ගණකාධිකරණය හා මූල්‍ය කළමනාකරණය)
වැලිහිඳ පතිරන්නැහැලාගේ අදීප කමල්ජිත් තිලකරත්න	අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)	විද්‍යාපති (කළමනාකරණය) ශාස්ත්‍රවේදී ඩිප්ලෝමාව (කළමනාකරණය)
බ්‍රිගේඩියර් වැලිවේරිය ලියනගේ අනිල් ක්‍රිශාන්ත පෙරේරා ආර්ඩබ්පි ආර්එස්පි යුඑස්පි	අධ්‍යක්ෂ (මෙහෙයුම්)	විද්‍යාපති උපාධිය (ආරක්ෂක අධ්‍යනය) ඩිප්ලෝමාව (ආරක්ෂක කළමනාකරණය) ඩිප්ලෝමාව (ජාත්‍යන්තර සම්බන්ධතා) PQHRM (CIPM), NDHRTD (CIPM)

2.6 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල විස්තර

2.6.1 2021 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් ඒකකවල සිවිල් කාර්යය මණ්ඩලය

වගුව 2.2: 2021.12.31 දිනට කාර්යය මණ්ඩල විස්තරය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අධ්‍යක්ෂ	6	5	1
අභ්‍යන්තර විගණක	1	1	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ	18	0	18
සහකාර අධ්‍යක්ෂ	15	11	4
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	25	23	2
ගිණුම් නිලධාරී	1	1	0
පරිපාලන නිලධාරී	1	0	1
විමර්ශන නිලධාරී	1	1	0
පුද්ගලික සහකාර	1	0	1
දුර දැනීම/භූ තොරතුරු දත්ත පද්ධති විශ්ලේෂක	1	1	0
දත්ත පද්ධති විශ්ලේෂක	1	1	0
තොරතුරු තාක්ෂණ නිලධාරී	1	0	1
ජාල පද්ධති පරිපාලක	1	0	1
පුස්තකලයාධිපති	1	0	1
සංවර්ධන නිලධාරී	101	0	101
භාෂා පරිවර්තක	2	0	2
තොරතුරු තාක්ෂණ සහකාර	6	5	1
චලන හා නිශ්චල කැමරා ශිල්පී	1	1	0
සන්නිවේදන කාර්මික ශිල්පී	3	1	2
ගුවන් විදුලි ක්‍රියාකරු	1	1	0
කළමනාකරණ සහකාර/ආපදා කළමනාකරණ සහකාර	201	174	27
රියදුරු	39	39	0
කාර්යාල සහායක	35	35	0
එකතුව	**465**	**302**	**163**

2.6.2 2021 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් ඒකකවල ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය නියෝජනය කරන කාර්යය මණ්ඩලය

වගුව 2.3: 2021 දෙසැම්බර් 31 දිනට ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය නියෝජනය කරන කාර්යය මණ්ඩලයේ විස්තර

ස්ථානය	ශ්‍රී ලංකා ගුවන් හමුදාව		ශ්‍රී ලංකා නාවික හමුදාව		ශ්‍රී ලංකා ගුවන් හමුදාව		ශ්‍රී ලංකා පොලිසිය		එකතුව	
	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රධාන කාර්යාලය	2	8	2	9	1	7	1	11	6	35
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - කොළඹ	-	-	1	-	1	16	-	-	2	16
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - පුත්තලම	-	-	-	-	1	6	-	-	1	6
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - හම්බන්තොට	-	-	1	-	1	13	-	-	2	13
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - කළුතර	1	19	1	-	-	-	-	-	2	19
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - ගාල්ල	1	23	-	-	-	-	-	-	1	23
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - මාතර	2	27	-	-	-	-	-	-	2	27
එකතුව	**6**	**77**	**5**	**9**	**4**	**42**	**1**	**11**	**16**	**139**
මුළු එකතුව	**83**		**14**		**46**		**12**		**155**	


2.6.3 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

මෙම ඒකක දිස්ත්‍රික් 25 තුළම පිහිටුවා ඇත. එක් එක් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක, කළමනාකරණ සහකාරවරුන්ගෙන්, කාර්යාල සහායකවරුයෙකු මෙන්ම රියදුරුවරයෙකුගෙන් ද සමන්විත වේ.

දිස්ත්‍රික්කය ආපදාවලට භාජනය වීමට ඇති නැඹුරුතාවය අනුව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහායකයින් සංඛ්‍යාව වෙනස් වේ. මුළු එකතුව ගත් කල දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් 25 දෙනෙකු සහ කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) 109 දෙනෙකු දිස්ත්‍රික්ක 25හි සේවය සඳහා යොදවා ඇත.

කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක ශ්‍රී ලංකා යුධ හමුදා සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන්ගේ පරිපාලනය යටතේ ද සෙසු දිස්ත්‍රික් ඒකක සිවිල් දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්ගේ පරිපාලනය යටතේ ද ක්‍රියාත්මක වේ.

සියලුම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක එක් එක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධව දිස්ත්‍රික් ලේකම්ගේ මෙහෙයුම් අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. රූප සටහන 2.2හි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය දැක්වේ.




සටහන 2.2: දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය

2.7 2021 වර්ෂයේ ඇති වූ ආපදා තත්ත්වයන් පිළිබඳ විග්‍රහය


2.7.1 ආපදා බලපෑම් විශ්ලේෂණය - (www.desinventar.lk)

සමස්ත බලපෑම - 2021


2021 වසරේදී නියඟය, ගංවතුර, නායයෑම්, කණ්ඩි කඩා වැටීම්, දියේ ගිලීම්, දැඩි සුළං, ගිණි ගැනීම්, අකුණු අනතුරු යනාදියෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 771,418ක් පමණ වේ. ගංවතුර නිසා පමණක් බලපෑමට ලක්වූ පුද්ගලයන් ගණන 728,583ක් පමණ වේ. එමෙන්ම නියඟය හේතුවෙන් පුද්ගලයන් 8,915 සහ දැඩිසුළං සහ සුළි සුළං තත්ත්වයන් හේතුවෙන් පුද්ගලයන් 27,267ක් බලපෑමට ලක්ව ඇත. ඉහතින් සඳහන් කල ආපදා තත්ත්වයන් හේතුවෙන් මරණයට පත් වූ සංඛ්‍යාව 189ක් වන අතර තුවාල සිදුවීම් 90ක් වාර්තා වී ඇත. තවද, 2020 වසරට සාපේක්ෂව මරණ සිදුවීම් අවස්ථා සාපේක්ෂව වැඩි අගයක් වාර්තා වී ඇත.



සටහන 2.3: එක් එක් ආපදාවලින් සිදු වූ මරණ




සටහන 2.4: මරණ සහ තුවාල සිදුවීම් (2018 – 2021)



සටහන 2.5: ආපදාවන්ට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව


<u>නිවාස හානි - 2021</u>

2018, 2019, 2020 සහ 2021 සාපේක්ෂව සිදුවූ පූර්ණ හා අර්ධ නිවාස හානි අවස්ථා සාපේක්ෂව අවම අගයක් වාර්තා වී ඇත. ඒ අතරින් නිවාස 8,630ක් අර්ධ වශයෙන් හානි වී ඇති අතර නිවාස 264ක් පූර්ණ වශයෙන් හානි වී ඇත.



සටහන 2.6: 2018 සිට 2021 දක්වා පූර්ණ හා අර්ධ නිවාස හානි සිදු වී ඇති ආකාරය


2021 මැයි සහ නොවැම්බර් මාසයන්හි නිවාස හානි වැඩියෙන් වාර්තා වී ඇති අතර මෝසම් සුලං තත්ත්වයන් හේතුවෙන් ඇතිවූ දැඩි සුලං සහ ගංවතුර එයට හේතු වී ඇත. එම හානි විශාල වශයෙන් වාර්තා වන්නේ රත්නපුර, ගම්පහ, කෑගල්ල සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන් වෙතිනි.



සටහන 2.7: නිවාස හානි සිදු වී ඇති ආකාරය

එක් එක් අපදාවලින් විනාශ වූ / හානියට පත් නිවාස - 2021


2021 වසර තුළ ආපදාවන් අනුව සිදුවූ නිවාස හානි සලකා බැලීමේ දී ගංවතුර හේතුවෙන් නිවාස 3791ක් අර්ධව හානි වී ඇති අතර නිවාස 96ක් පූර්ණව හානි වී ඇත. එමෙන්ම දැඩි සුලං හේතුවෙන් නිවාස 3961ක් අර්ධව හානි වී ඇති අතර නිවාස 58ක් පූර්ණ වශයෙන් හානියට පත්ව ඇත.




සටහන 2.8: ආපදා අනුව සිදු වූ ඇති නිවාස හානි

2021 වර්ෂයේ ආපදා හේතුවෙන් බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කයන්


ඉහත සඳහන් කල ආපදා තත්ත්වයන් හේතුවෙන් නිවාස හානි සිදුවී ඇති දිස්ත්‍රික්ක පිළිබඳව පහත සඳහන් වන අතර රත්නපුර සහ ගම්පහ දිස්ත්‍රික්කයන් වෙතින් වැඩිම හානි වාර්තා වී ඇත.




සටහන 2.9: 2021 වර්ෂයේ සිදු වී ඇති නිවාස හානි - දිස්ත්‍රික් අනුව




සටහන 2.10: ආපදාවලින් මරණයට පත්වී ඇති ආකාරය



සටහන 2.11: ආපදාවලින් බලපෑමට ලක් වී ඇති ආකාරය



සටහන 2.12: ගංවතුර හේතුවෙන් බලපෑමට ලක්වූ පුද්ගලයින්



සටහන 2.13: නියඟය හේතුවෙන් බලපෑමට ලක්වූ පුද්ගලයින්

3. ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

3.1 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2022 – 2030 වර්ෂය සඳහා සැකසීම

2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනතට අනුකූලව ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම මූලික කොට ගනිමින් අනෙකුත් සියලුම සැලසුම් සකස් කළ යුතු වේ. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ සම්බන්ධ පුළුල් රාමුව නියෝජනය කරන අතර එමඟින් රට තුළ ආපදා අවදානම අවම කිරීම සම්බන්ධ පස් අවුරුදු සැලැස්මකි. ආපදා කළමනාකරණ පනතට අනුකූලව ඉහත සැලසුම පාදක කොට ගනිමින් ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම, ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් හා අනෙකුත් ආපදා කළමනාකරණ සැලසුම් සකස් කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුවට අනුකූලව සකස් කරන ලද 2022 – 2030 දක්වා වූ ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ ඉදිරි වසර 08ක කාලය සඳහා ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සැකසීම ආරම්භ කර අවසන් අදියරට පැමිණ ඇත.

3.2 ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලැස්ම සඳහා වූ ක්‍රමෝපායක් සැකසීම

ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලැස්ම පිළිබඳව කෙටුම්පතක් සකස් කරන ලද අතර එම සැලැස්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරු, සහකාර අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරු හා මේ පිළිබඳව විශේෂ දැනුමක් ඇති අයගේ අදහස් හා යෝජනා ලබා ගැනීමේ වැඩමුළුවක් දඹුල්ලේ දී පැවැත්විය. මේ සඳහා ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය (ADPC) ආයතනයෙන් මූල්‍යාධාර ලබා ගන්නා ලදී.

3.3 ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම (IDMP) - සියලුම අමාත්‍යාංශ සඳහා සූදානම් වීමේ මාර්ගෝපදේශ


2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ 10 වැනි වගන්තියට අනුව, සියලුම අමාත්‍යාංශ, රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ සියලුම රාජ්‍ය ආයතන විසින් අදාළ ආයතන සඳහා ආපදා අවදානම් කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වේ. තවද, ආපදා කළමනාකරණ පනතේ 8 වැනි වගන්තිය මගින් ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පවරා ඇත. ඒ අනුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආයතනික මට්ටමින් ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට දායක වන සහ ශ්‍රී ලංකාවේ ජාතික ආපදා අවම කිරීමේ උපාය මාර්ගයට අනුගතව සකස් කරන ලද මාර්ගෝපදේශය සකස් කර ප්‍රකාශයට පත් කර ඇත.



ජාතික ආපදා කළමනාකරණ සැලැස්මට අනුව එක් එක් ආයතනය සඳහා නිශ්චිත ආයතනික ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කල යුතු වේ. ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සංවර්ධනය කිරීමේදී සියලුම අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු සහ ආයතන විසින් අනුගමනය කළ යුතු ක්‍රියාවලිය පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම මාර්ගෝපදේශය සපයයි. හදුනාගත් රාජ්‍ය ආයතන අතර මෙම මාර්ගෝපදේශ ග්‍රන්ථය දැනුවත් කිරීමට සැලසුම් කර ඇත.

3.4 ආපදා මධ්‍යයේ විභාග සඳහා ප්‍රවේශය - අ.පො.ස සාමාන්‍ය පෙළ (සා.පෙළ) විභාග - 2020


2020 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබූ අ.පො.ස සාමාන්‍ය පෙළ (සා.පෙළ) විභාග 2021 වර්ෂයේ පැවැත්විනි. මෙම විභාගය පවත්වන කාලවලදී හදිසි ආපදාවක් වුවහොත් ශිෂ්‍යාන්ට බාධාවකින් තොරව විභාගයට පෙනී සිටීමට හැකිවන ආකාරයට ප්‍රතිචාර දැක්වීම සඳහා සැලැස්මක් විභාග දෙපාර්තමේන්තුවේ ඉල්ලීම් අනුව සකස් කරන ලදී. මෙම මාර්ගෝපදේශය සකස් කිරීමේදී COVID 19 වසංගතය, කාලගුණික, දේශගුණික සාධක සැලකිල්ලට ගෙන සෞඛ්‍ය අමාත්‍යාංශය, කාළගුණික විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යන ආයතනවල උපදෙස් අනුව සකස් කරන ලදී. මෙම මාර්ගෝපදේශය ආසියානු පැසිපික් සංවිධානය (APAD) ආයතනයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව සකස් කරන ලදී.



3.5 ආරක්ෂිත මධ්‍යස්ථාන කළමනාකරණය - ආරක්ෂිත මධ්‍යස්ථාන කළමණාකරුවන් සඳහා අත්පොත

හදිසි ආපදා අවස්ථාවලදී ආපදාවලට ලක් වන මහජනතාව සඳහා සුරක්ෂිත මධ්‍යස්ථාන ස්ථාපිත කල යුතු අතර ඒ අනුව එම සුරක්ෂිත මධ්‍යස්ථාන කළමණාකරනය කිරීම කාර්යක්ෂම විය යුතුය. තවද මෙම COVID-19 වසංගතය හමුවේ මෙම තත්වය තවත් සංකීර්ණ විය හැක. මෙම සියලු කරුණු සැලකිල්ලට ගෙන සුරක්ෂිත මධ්‍යස්ථානවලට පැමිණෙන විපතට පත් පුද්ගලයින්ට ඔවුන්ගේ ආරක්ෂාව සහ අභිමානය සහතික කිරීම සඳහා හදිසි ජීවිතාරක්ෂක ආධාර සැපයීම සඳහා ගොඩනගා ගැනීම ඉතා වැදගත් වේ. COVID-19 මධ්‍යයේ ආරක්ෂිත මධ්‍යස්ථාන කළමනාකරණ ප්‍රමිතීන් පිළිබඳ කළමනාකරුවන්ට අවශ්‍ය කුසලතා සහ දැනුම ලබා දීම සඳහා , මෙම අත්පොත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූලිකත්වයෙන් සෞඛ්‍යය අමාත්‍යාංශයේ ආපදා පෙර සූදානම සහ ප්‍රතිචාර අංශය, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල, සංක්‍රමණ සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය, යන ආයතනවලින් තාක්ෂණික දැනුම හා මේ සඳහා මූල්‍ය දායකත්වය එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) විසින් දරන ලදී. ශ්‍රී ලංකාවේ ආරක්ෂිත මධ්‍යස්ථාන කළමනාකරණයට සම්බන්ධ ප්‍රධාන රාජ්‍ය ආයතනවල අදාළ සියලුම නිලධාරීන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ පහසුව සඳහා මෙම පොත් පිංච භාෂා තුනෙන්ම ප්‍රකාශයට පත් කරන ලදී.





3.6 ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ ජාත්‍යන්තර දිනය (IDDRR)

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ඔක්තෝබර් 13 වන දින ආපදා අවදානම අවම කිරීමේ ජාත්‍යන්තර දිනය ලෙස නම් කර ඇත. 2015-2030 ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුව සමඟින් ජීවිත, ජීවනෝපාය සහ සෞඛ්‍ය පිළිබඳ ආපදා අවදානම් සහ හානි අවම කිරීම සඳහා ලබා ඇති ප්‍රගතිය ගැන සාකච්ඡා කිරීමට සාමාජික රටවලට ලබා දී ඇති අවස්ථාවකි. ආපදා අවදානම් අවම කිරීම සඳහා වන ජාත්‍යන්තර දිනය 2021 ඔක්තෝම්බර් 13 වන දින සමරනු ලැබුවේ, "එකට පමණයි... අපට ග්‍රහලෝකය සුරැකිය හැක" යන මූලික තේමාව මත සෙන්දායි රාමුවේ ඉලක්කය "F" මත පදනම්වය. ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ ජාත්‍යන්තර දිනය සමරන ලදි.

මෙම ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ ජාත්‍යන්තර දිනය සැමරුම් වැඩසටහන ආපදා කළමණාකරන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද අතර එය 2021 ඔක්තෝබර් 13 වන දින කොළඹ BMICH හිදී පස්වරු 1.00 සිට 4.30 දක්වා පැවැත්විණි. දෙමුහුන් (මාර්ගස්ථ සහ භෞතික) සිදුවීමක ස්වරූපයෙන් පැවැතිවූ අතර වැඩසටහනේ තේමාව වූයේ "COVID-19 සහ පද්ධතිමය අවදානම" මෙම උත්සවය ශ්‍රී ලංකාවේ දෘෂ්ටි කෝණයෙන් වසංගතය හේතුවෙන් සැලකිය යුතු ලෙස බලපා ඇති ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ ජාත්‍යන්තර දිනය ලෝක සංවිධාන ප්‍රධානීන්ගේ විශේෂ පණිවිඩ ඇතුළුව දේශීය හා විදේශීය වෘත්තිකයන් සහ විද්වතුන් විසින් ප්‍රකාශ කරන ලද අදහස් සහ අදහස් පිළිබඳ විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම සහ සාකච්ඡා කිරීම මෙම උත්සවයේදී සිදු විය. දේශීය හා විදේශීය ලියාපදිංචි සහභාගිවන්නන් 500ක් අන්තර්ජාලය හරහා සම්බන්ධ වූ අතර අනුගාමිකයින් 1500ක් යූ ටියුබ් නාලිකාව හරහා එක් විය. ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, සැම්බියාව, මාලදිවයින, මැලේසියාව, කෙන්යාව, ජපානය, ඉන්දියාව, බෙලරුස්, හයිටි, මෙක්සිකෝව, චීනය, ෆීජි, මියන්මාරය, බංග්ලාදේශය, නයිජීරියාව, ජෝර්දානය, බ්‍රසීලය, කැමරූන්, පිලිපීනය, සෞදි වැනි රටවල් වලින් විදේශීය සහභාගිවන්නන් ඇතුළත් වේ. අරාබිය, සෝමාලියාව, ටැන්සානියාව, නවසීලන්තය, කොංගෝව, ඉන්දුනීසියාව, බොස්නියාව ආදී වශයෙන් තවදුරටත් සමාජ මාධ්‍ය හරහා පුළුල් ආවරණයක් ලැබිණි. මෙම අවස්ථාවට Huddersfield විශ්වවිද්‍යාලය (UK) සහ ආසියානු පෙර සූදානම් මධ්‍යස්ථානය විසින් අනුග්‍රහය දක්වන ලදී .





3.7 ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය (WTAD)

එක්සත් ජාතීන්ගේ සංවිධානය, විසින් නොවැම්බර් 5 වන දින ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය ලෙස 2015 දෙසැම්බර් 15 දින සම්මත කරන ලදී. එය ලොව පුරා සුනාමි දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමට සහ අවදානම් අවම කිරීම සඳහා නව්‍ය ප්‍රවේශයන් බෙදා ගැනීමට කැපවී සිටී. මෙම දිනය සැමරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් COVID-19 වසංගතය මධ්‍යයේ "ඉගෙන ගන්න, බෙදාගන්න, ක්‍රියා කරන්න" යන තේමාව යටතේ දේශීය හා ජාත්‍යන්තර උත්සවයක් පවත්වන ලදී: සුනාමි අනතුරු ඇඟවීම් සහ අවම කිරීම සඳහා වූ ජාත්‍යන්තර සහයෝගීතාව දිවයිනේ වෙරළබඩ දිස්ත්‍රික්ක දාහතරේම (14) දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක (DDMCU) සම්බන්ධ

කර ගනිමින් දේශීය වැඩසටහන 2021 නොවැම්බර් 5 වන දින පවත්වන ලද අතර සහකාර අධ්‍යක්ෂවරුන් විසින් ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා සකස් කරන ලද සුනාමි මෙහෙයුම් සැලසුම් ඉදිරිපත් කිරීමට අවශ්‍ය විය. සීමිත පිරිසකගේ සහභාගිත්වයෙන් ජාත්‍යන්තර වැඩසටහන (දෙමුහුන්) 2021 නොවැම්බර් 8 වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. සුනාමි ව්‍යසනයන් සම්බන්ධ ප්‍රධාන මාතෘකා පිළිබඳව දේශීය හා විදේශීය වෘත්තිකයන් සහ විද්වතුන් විසින් ප්‍රකාශ කරන ලද අදහස් සහ අදහස් හුවමාරු කර ගැනීම ප්‍රධාන කරුණක් විය. මෙම ජාත්‍යන්තර සුනාමි දැනුවත් කිරීමේ දිනය සඳහා සහභාගි වූ අයගෙන් දේශීය- 39% සහ විදේශිය - 61% කි. විදේශීය සහභාගිවන්නන් ඉන්දියාව, ඇෆ්ගනිස්ථානය, ඇල්ජීරියාව, ඕස්ට්‍රේලියාව, බංග්ලාදේශය, බ්‍රසීලය, කැනඩාව වැනි රටවලින් ඇතුළත් වේ. චීනය, කොලොම්බියාව, ඊජිප්තුව, ප්‍රංශය, ජෝර්ජියාව, ඝානාව, ග්‍රෙනාඩා, ග්වාතමාලාව, ඉන්දුනීසියාව, ජපානය, කොරියාව, කෙන්යාව, ලිබියාව, මැඩගස්කරය, මැලේසියාව, මොරිෂස්, මෙක්සිකෝව, මියන්මාරය, නේපාලය, නවසීලන්තය, නයිජීරියාව, නෝර්වේ, ඕමානය, පකිස්ථානය පැනමාව, පිලිපීනය, පෘතුගාලය, කටාර්, සෙනගල්, දකුණු අප්‍රිකාව, තායිලන්තය, එක්සත් රාජධානිය (එක්සත් රාජධානිය), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (එක්සත් අරාබි එමීර් රාජ්‍යය), එක්සත් ජනපදය (එක්සත් ජනපදය), උස්බෙකිස්තානය යන රටවල් 85ක් සහභාගී වූ අතර භෞතිකව සහභාගී වූහ. මෙම අවස්ථාවට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) අනුග්‍රහය දක්වා ඇත.

3.8 "සෙවීමේ සහ මුදවා ගැනීමේ සිවිල්-මිලිටරි සංවාදය" පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

"සෙවීමේ සහ මුදවා ගැනීමේ සිවිල්-මිලිටරි සංවාදය" පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජෙනරාල් විශ්‍රාමික මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ජපාන තානාපති කාර්යාලයේ පළමු ලේකම් කොෂි අයි වියාගෝ මෙනවියගේ සහ නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය හේමන්ත හේරත් මහතාගේ සහභාගීත්වයෙන් ජාතික ආරක්ෂක හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේ දී 2021 දින පැවැත්විණි.

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ විද්වතුන්ගේ සහභාගීත්වයක් සහිතව මීට සමගාමීව ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ "සෙවීමේ සහ මුදවා ගැනීමේ සිවිල්-මිලිටරි සංවාදය" තේමා කරගනිමින් විද්වත් කථිකාවතක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ආසියා පැසිපික් සංධානයේ අනුග්‍රහය සහිතව ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සෙවීම් සහ මුදවාගැනීම් පිළිබඳ සිවිල් සහ ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය ඇතුලු ආරක්ෂක අංශ නිලධාරීන් පුහුණු කිරීම සිදු කරනු ලබන අතර එම පුහුණුව ද සාර්ථකව නිමකළ නිලධාරීන් හට සහතික පත් ප්‍රධානය ද මීට සමගාවීම සිදු කෙරිණි.





සෙවීම සහ මුදවා ගැනීමේ සිවිල් - මිලිටරි සංවාදය පිළිබඳ සාකච්ඡාව

3.9 කොවිඩ් 19 (Covid 19) වසංගත මැඩලීම සඳහා ආපදා කළමණාකරන මධ්‍යස්ථානයේ දායකත්වය

2021 වර්ෂය තුළදී ආපදා කළමණාකරන මධ්‍යස්ථානය කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය මැඩලීමට ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කල අතර විශේෂයෙන්ම නිරිත දිග හා ඊසාන දිග මෝසම් වර්ෂාව ඇති විය හැකි ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් ඇතිවිය හැකි ආපදාවකදී මතුවන සෞඛ්‍ය අභියෝගයට මුහුණ දීම සඳහා සැලසුම් සකස් කරන ලදී. මේ සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් විවිධ පාර්ශවකාර ආයතනයන් නියෝජනය කරමින් 200 අධික නිලධාරින් පිරිසකගේ සහභාගිත්වයෙන් කොවිඩ් 19 වසංගතය පවතින ප්‍රදේශවල ක්‍රියා කල යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කර ලද අතර එය භාෂා ත්‍රිත්වයෙන්ම පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

තව ද, සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ කොවිඩ් 19 වසංගතය හමුවේ ඇති විය හැකි ආපදා අවස්ථාවකදි සෙවීම් හා මුදවා ගැනීමේ කන්ඩායම්වලට අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කර ඒවාද අදාළ අයතනවලට බෙදා දෙන ලදි. මීට අමතරව සියලුම දිස්ත්‍රික් ආපදා කළමණාකරන ඒකකවලට කොවිඩ් 19 වසංගතය මැඩලීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගවලට දායකත්වය ලබා දෙමින් ආපදා ප්‍රතිචාරවලට අවශ්‍යවන පුද්ගලික ආරක්ෂණ උපකරණ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මානුෂික ආයතනවල සහයෝගය ද ලබා ගනිමින් සිදු කරන ලදී. කොවිඩ් 19 වසංගතය හමුවේ ඇති විය හැකි ආපදා අවස්ථාවලදී මහජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය අත් පත්‍රිකා පෝස්ටර් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් දිස්ත්‍රික්ක 25ට ලබා දීමෙන් ජනතාවගේ දැනුම වැඩිදියුණු කරන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද මාධ්‍ය වැඩසටහන් සහ අනෙකුත් වැඩමුලු හරහා සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරගෙන මහජනතාවට දැනුම ලබාදෙන ලදි. එමෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි ඇමතුම් අංක 117ට ලැබෙන කොවිඩ් 19 සම්බන්ධ ලැබෙන දුරකථන ඇමතුම් සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදි.

3.10 වර්තමාන ආපදා තත්ත්වය හමුවේ සහන සැලසීම පිළිබඳ සාකච්ඡාව

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2021 නොවැම්බර් මස 16 වන දින පෙ.ව.10.30ට ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පරිශ්‍රයේ කමිටු කාමර අංක 02හි ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාව

නියෝජනය කරන ගරු අමාත්‍යවරු 13 දෙනෙකු ද, ගරු රාජ්‍ය අමාත්‍යවරු 8 දෙනෙකු ද, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු 21 දෙනෙකු ද පාර්ශවකාර අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආපදා කළමනාකරණ ක්‍රියාවලියට සෘජුව සම්බන්ධ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා මණ්ඩලවල ප්‍රධානීන් 22ගේ සහභාගීත්වයෙන් 2021 නොවැම්බර් මස ඇති වූ ගංවතුර හා නායයෑම් පිළිබඳ පැවති තත්වයන් හා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දීර්ඝව සාකච්ඡා කරන ලදි. මෙහිදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ මහතා රටතුළ උද්ගතව ඇති ආපදා තත්වය පිළිබඳව හා ඒ සඳහා සහන සැලසීම හා නැවත පදිංචි කිරීමේදී හඳුනාගෙන ඇති ගැටලු හා අභියෝග පිළිබඳ පෙන්වා දෙන ලදි.

මෙම සාකච්ඡාවට බදුල්ල, අනුරාධපුර, නුවර එළිය, මහනුවර, කෑගල්ල, රත්නපුර, කුරුණෑගල, ගම්පහ, පුත්තලම, මාතලේ, කළුතර හා මොණරාගල යන දිස්ත්‍රික්කවල නියෝජනය කරන මැති ඇමතිවරුන් සහභාගී වූ අතර ඒ ඒ පළාත් හා දිස්ත්‍රික්වල ආපදා තත්වයන් පිළිබඳ අදහස් දක්වන ලදි.

<u>නැවත පදිංචි කිරීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දී ඇති ගැටළු</u>

- බදුල්ල, නුවර එළිය, කෑගල්ල, මාතලේ, මහනුවර සහ කුරුණෑගල යන දැඩි අවදානම් ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කිරීමේදී විකල්ප ඉඩම් නොමැති වීම ප්‍රධාන ගැටළුවක් වී ඇත.
- හඳුනාගත් ඉඩම් අත්පත් කර ගැනීමට නොහැකි වීම.
- ඉඩම් ලබා ගැනීමට හා නිවාස ඉදිකිරීමට අනුමත ප්‍රතිපාදන සීමාව යාවත්කාලීන නොවීම.
- නැවත පදිංචි කිරීම සඳහා ස්ථිර නිවාස ලබාදෙන පවුල් පෙර පදිංචි ස්ථානයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් විධිමත් නීති නොවීම.

<u>ආපදා අවදානම් අවම කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා</u>

- අවදානම් සහිත නිවාස ක්‍රමවත්ව හා විධිමත්ව අදාළ ස්ථානවලින් ඉවත් කර කඩිනමින් නැවත පදිංචියට යොමු කිරීම මඟින් ආපදා අවස්ථාවන්හි දී සහන ලබා දීම සඳහා දැරිය යුතු විශාල මුදලක් ඉතිරි කර ගත හැකි බව.
- කොළඹ දිස්ත්‍රික්කය වැනි ජනගහනය වැඩි දිස්ත්‍රික්කවල නැවත පදිංචි කිරීමේදී මහල් නිවාස ක්‍රමය වෙත පිවිසීම සුදුසු බව.
- විවිධ හේතූන් මත නැවත පදිංචි වීම ප්‍රතික්ෂේප කරනු ලබන පවුල් සඳහා මහල් නිවාස යෝජනා ක්‍රම හඳුන්වා දීම.
- නිවාස ඉදි කිරීම සඳහා නුවර, නුවර එළිය, බදුල්ල යන ප්‍රදේශයන්හි වතු ආශ්‍රිත ඉඩම් ලබා ගැනීම වඩාත් යෝග්‍ය බව පෙන්වා දීම.

<u>පවතින ආපදා අවදානම් තත්වයන් අවම කිරීම සඳහා ගන්නා ලද තීරණ</u>

- නැවත පදිංචි කිරීමේ යෝජනා සඳහා ඉඩම් අවශ්‍යතාවය හඳුනාගනිමින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මැදිහත්වීම මත අදාළ ඉල්ලීම් නිසි පරිදි සිදු කිරීම.
- වගකීම් දැරිය යුතු සියලු රාජ්‍ය ආයතන මැදිහත්වීමෙන් මෙම ආපදා තත්වයන් වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම.

- ප්‍රාදේශීය ලේකම්වරු හා වැවිලි සමාගම් හිමිකරුවන් සමඟ සාකච්ඡා කොට ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.
- ජල ගැලීම් තත්වය වැළැක්වීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පහත් බිම් සංවර්ධන මණ්ඩලය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාව යන ආයතනයන්ගේ ඒකාබද්ධ වූ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතු බැවින් සියලු ආයතන එක් වී කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු බව යෝජනා විය.
- රාජ්‍ය ආයතන සම්බන්ධීකරණයෙන් ඉඩම් අවශ්‍යතාවය හා විකල්ප ඉඩම් හඳුනාගැනීම පිළිබඳ යෝජනාවලියක් දිස්ත්‍රික් ලේකම් මගින් ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
- ආපදා තත්වය හේතුවෙන් බලපෑමට ලක්වන නිවාස ප්‍රතිසංස්කරණය හෝ ඉඩම්වල නව ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස ණය ලබා ගැනීමේ හැකියාවක් ඇති බැවින් එවැනි ඉල්ලීම් දිස්ත්‍රික් ලේකම් මගින් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.
- ගැටඹේ ගන්නෝරුව ප්‍රදේශයේ මහවැලි ගඟ ආශ්‍රිතව නිර්මාණය වී ඇති වැලි දූපත් හේතුවෙන් අනාගතයේ යම් ආපදාවක් ඇති වීමේ හැකියාවක් පවතින බැවින් මේ සම්බන්ධයෙන් භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ පූර්ව අනුමැතියට යටත්ව සුදුසු සංවර්ධන කටයුතු වෙනුවෙන් අදාළ වැලි ඉවත් කිරීමේ කටයුතු සිදු කිරීම සුදුසු බව.

3.11 ගෝලීය උණුසුම, කාලගුණික හා දේශගුණික විපර්යාසයන් හමුවේ රට තුළ වැඩිවීමෙන් පවතින ආපදා හා ආපදා අවදානම් තත්වයන් කළමනාකරණ කිරීම

රටේ තීව්‍ර වෙමින් පවතින ආපදා අවදානම නිසා ඇතිවන හදිසි ආපදා තත්වයන් හේතුකොට ගෙන සිදුවන ජීවිත හා දේපල විනාශය සීඝ්‍ර ලෙස වැඩිවෙමින් පවතී. 2021 වර්ෂයේ ඇති වූ ආපදා තත්වයන් සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2021.11.13 වන දින මේ පිළිබඳ විවෘත විවාදයක් පැවැති අතර ඒ අනුව රටේ පවතින ආපදා අවදානම් තත්වය අවම කරමින් මහජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කිරීම සඳහා රටේ පවතින ආපදා කළමනාකරණ යාන්ත්‍රණයේ ප්‍රමුඛතම ආයතනවල විශේෂඥවරුන්ගේ සමන්විත කමිටුවක් පත් කර ඒ අනුව යෝජනා හා අදහස් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට දැනුම් දී ඇත.

ඒ අනුව රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් මත රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයේ අතිරේක ලේකම්තුමාගේ මූලිකත්වයෙන් සියලුම ආපදා කළමනාකරණ ක්‍රියාවලියට දායකවන ප්‍රමුඛතම ආයතනවල විශේෂඥවරුන්ගේ රැස්වීමක් 2021.12.13 වන දින ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. එහිදී වර්තමානයේ පවතින නීතිරීති හා රෙගුලාසි අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමත්, පවතින ආපදා අවදානම සහ අනාගතයේ නිර්මාණය විය හැකි ආපදා අවදානම් තත්වයන් කළමනාකරණය කිරීමට අවශ්‍ය නීති සම්පාදනයත්, ආපදා කළමනාකරණ ක්‍රියාවලිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණය භාවිතය, දැඩි ආපදා අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන අදාළ ආයතනවලට

ලබාදීම, රටේ ආපදා අවදානම නිර්මාණය කරන පුද්ගලයන් හෝ කණ්ඩායම්වලට විරුද්ධව ක්‍රියා කිරීමට ශක්තිමත් හා නීත්‍යානුකූල ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම යනාදී කරුණු මෙහිදී සාකච්ඡාවට බඳුන් විය.

4. 2020 වර්ෂයේදී තාක්ෂණික අංශවල ප්‍රගතිය

4.1 පෙර සූදානම් හා සැලසුම් අංශය

2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් පරිදි දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, අවදානමට ලක්ව ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ රාජ්‍ය අංශයේ ආයතන ආදිය සඳහා ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සූදානම් හා සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයක් වේ. ගංවතුර, නායයෑම්, සුනාමි, සුළි සුළං ආදි ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව ඇතිවන උවදුරු සඳහා ආපදා පෙර සූදානම් කටයුතු සැලසුම් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙරසූදානම් හා සැලසුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන එක් කාර්යයක් වේ.

ආපදාවන් සිදුවන විට එයට ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට සහාය වන කෘත්‍යාත්මක ලේඛනයක් ලෙස ආපදා පෙර සූදානම් සැලැස්ම හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයන් තුළ සිදුවන ආපදා සඳහා ප්‍රතිචාර දක්වන ඉහළම කළමනාකාරීත්ව ආයතන වන්නේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවයි. කමිටුවේ සාමාජිකත්වය, අනු කමිටු සහ ඔවුන්ගේ කාර්යභාර්යයන් සහ වගකීම් මොනවාද යන්න සැලැස්ම තුළ ලේඛනගත කර ඇත.

පරිපාලන ප්‍රදේශය පිළිබඳ තොරතුරු, පවතින උවදුරු, අවදානම් තත්ත්වවල ප්‍රතිඵල සහ සිදුකරන ලද අවදානම් තත්ත්ව ඇගයීම්, ප්‍රධාන මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු, ප්‍රදේශය තුළ පවතින මානව හා භෞතික සම්පත් සහ ව්‍යසන ප්‍රතිචාර යාන්ත්‍රණය හා සම්බන්ධ විවිධ පාර්ශවකරුවන්ගේ වගකීම් පිළිබඳ තොරතුරු මෙම සැලසුම්වල අන්තර්ගත වේ.

4.1.1 දිස්ත්‍රික් මට්ටමේ පෙර සූදානම් සැලසුම්

2021 වර්ෂයට ලැබුණු රු.මි.7.5 යොදා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක හරහා ක්‍රියාත්මක කරන ලදි. රටෙහි ආර්ථික තත්වය සහ ව්‍යසන මඟින් ප්‍රජාවට ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන මුදා හරිනු ලැබේ.

එහි මූල්‍ය ප්‍රගතිය 83%ක් ලෙසත්, භෞතික ප්‍රගතිය 46%ක් ලෙසත් වාර්තා වී ඇත.

වගුව 4.1: දිස්ත්‍රික් අතර ප්‍රතිපාදන බෙදා හැරීම හා වියදම් කිරීම 2019 - 2021

වර්ෂය	මහා භාණ්ඩාගාරයෙන් අනුමත වූ මූල්‍ය ප්‍රතිපාදන (රු. මිලියන)	වියදම (රු. මිලියන)
2019	18.0	16.8
2020	5.50	4.54
2021	7.50	6.25

දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ව්‍යසන කළමනාකරණ සක්‍රියතාවය සවිමත් කිරීම උදෙසා විවිධ පෙර සූදානම් සැලසුම් කටයුතු සඳහා 2021 වර්ෂය තුළදී පෙර සූදානම් සැලසුම් අංශය විසින් ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. ව්‍යසන කළමනාකරණ සැලසුම් මුද්‍රණය

කිරීම සහ පිළියෙල කිරීම / සමාලෝචනය කිරීම සඳහා පාර්ශවකාර රැස්වීම්, වැඩමුළු සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිපාදන ලබා දී ඇත.

සුනාමි, ජලගැලීම් සහ නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම උවදුරු සිතියම්ගත කිරීම, අවදානම් තත්ත්ව විශ්ලේෂණය, ග්‍රාමීය මට්ටමේ ව්‍යසන කළමනාකරණ කමිටු ස්ථාපනය කිරීම වැනි ප්‍රජා මට්ටමේ ව්‍යසන ප්‍රතිචාර වැඩසටහන් පැවැත්වීම, ජලාශ වේලි බිඳී යාමට පූර්වෝපායක් ලෙස, ජලාශ වේලි පහළ බෑවුමේ ජීවත්වන ජනතාව සඳහා හදිසි අවස්ථා තත්ව සඳහා ප්‍රතිචාර දැක්වීමට ප්‍රජා සහභාගීත්වය සහිත පෙර සූදානම් සැලසුම් නිර්මාණය කිරීම හා දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහා ද මෙම අංශය විසින් ප්‍රතිපාදන සලසා දෙනු ලැබේ.

4.1.2 ආපදා පෙර සූදානම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලසුම්

2021 වර්ෂයේ දී මෝසම් වර්ෂාව සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා කොළඹ, නුවරඑළිය, ගාල්ල, මාතර හම්බන්තොට, මාතලේ, මන්නාරම, යාපනය, අම්පාර හා කළුතර යන දිස්ත්‍රික්කවල පවතින ආපදා සැලකිල්ලට ගෙන අදාළ පාර්ශව ආයතනවල සහයෝගයෙන් ආපදා අවස්ථාවල ඉතා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමට මෙම මෝසම් මෙහෙයුම් සැලසුම් සකසන ලදී. මේ සඳහා රුපියල් ලක්ෂ 317,720.00ක් වියදම් දරන ලදි.

4.1.3 ආපදා අවදානම් ප්‍රදේශවල දැන්වීමේ පුවරු සවි කිරීම

නායයෑම් හා ගංවතුර හා සුනාමි ආපදාවලට පාත්‍රවන ප්‍රදේශවල මහජනතාව ආපදා පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෙම දැන්වීම් පුවරු සවි කරන ලදී. මාතර, හම්බන්තොට, කෑගල්ල, බදුල්ල, අනුරාධපුර, යාපනය, කළුතර, මාතර, මාතලේ, ගම්පහ හා මන්නාරම යන දිස්ත්‍රික්කවල සවිකරන ලදී. එමෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මෙම අවදානම් සහිත ප්‍රදේශවල දැන්වීම් පුවරු 250ක් 2021 වර්ෂයේ දී සවිකරන ලදී.

වගුව 4.2: 2021 වර්ෂයේ සවි කල දැන්වීම් පුවරු පිළිබඳ විස්තර

අංකය	දිස්ත්‍රික්කය	වෙන් කළ ප්‍රමාණය	සම්පූර්ණ කළ ප්‍රමාණය	වියදම
1	මාතලේ	20	22	160,600.00
2	මන්නාරම	15	15	132,750.00
3	කෑගල්ල	20	80	739,000.00
4	බදුල්ල	20	20	90,000.00
5	අනුරාධපුර	15	15	135,000.00
6	හම්බන්තොට	10	33	381,000.00
7	කළුතර	20	8	76,800.00
8	ගම්පහ	20	20	200,000.00
9	යාපනය	10	25	284,350.00
10	මාතර	10	12	133,500.00
එකතුව			**250**	**2,333,000.00**



දැන්වීම් පුවරු සවි කිරීම - හම්බන්තොට දිස්ත්‍රික්කය



දැන්වීම් පුවරු සවි කිරීම - අනුරාධපුර දිස්ත්‍රික්කය

2013 සිට 2021 දක්වා දිස්ත්‍රික් 25 තුළ ආපදා අවදානම් අවම කිරීම සඳහා සවිකර ඇති අවදානම් පුවරු පිළිබඳව විස්තරයන් පහත පරිදි වේ.

දියේ ගිලීම් අවදානම් පුවරු	572
සුනාමි අවදානම් පුවරු	175
නායයෑම් අවදානම් පුවරු	314
ගංවතුර අවදානම් පුවරු	58

4.1.4 මෝසම් පෙර සූදානම් වැඩසටහන - ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය

නිරිත දිග මෝසම හා ඊසාන දිග මෝසම බලපාන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරු සමඟ කළ පෙර සූදානම් ක්‍රියාකාරකම් ලෙස පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදය, හදිසි ස්ථානගත කිරීම්, කණ්ඩායම් ස්ථානගත කිරීම හා සහන සේවා කටයුතු හා කඳවුරු කළමනාකරණය පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. ඒ මඟින් සිදුවිය හැකි ජීවිත හා දේපල හානිය අවම කර ගැනීමට බලාපොරොත්තු වේ.

ජාතික මට්ටමෙන් කාලගුණික ආයතන ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් අධික වර්ෂාව හා සුළි සුළං පිළිබඳව ද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් නායයෑම් පිළිබඳව ද වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජල ගැලීම් පිළිබඳව ද අනාවැකි හා පුරෝකථනයන් පාදක කර ගනිමින් ජාතික මට්ටමේ පාර්ශවකාර ආයතන සහ ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් ලෙස ත්‍රිවිධ හමුදාව, පොලිසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡා පවත්වන අතර දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටම දක්වා රාජ්‍ය නිලධාරීන් හා ආපදා සඳහා ගොදුරුවන ජනතාව ඊට මුහුණ දී ජීවිත හා දේපලවලට සිදුවන හානිය අවම කර ගැනීමට මේ තුළින් බලාපොරොත්තු වේ.

මෙම වැඩසටහන මඟින් දිවයිනට වාර්ෂිකව බලපාන නිරිත දිග මෝසම් හා ඊසාන දිග මෝසම් කාලවකවානුවලදී දිවයිනට බලපාන අධික වර්ෂාපතනයත්, දැඩි සුළං තත්වයන් පදනම් කරගෙන එයට ගොදුරු වන දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු කැඳවා බලපෑ හැකි තත්වයන් (ගංවතුර, නායයෑම්, සුළි සුළං) සඳහා අදාළ දිස්ත්‍රික්ක සූදානම් කිරීම අරමුණ වේ.

2021 වසර සඳහා නිරිතදිග මෝසම් තත්වයට මුහුණදීම සඳහා වූ සැලසුම් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක (එකොළහක් 11) විසින් සකස් කරන ලදී. හදිසි ප්‍රතිචාර සඳහා සූදානම් වීම පිළිබඳව මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක හා දිස්ත්‍රික් ලේකම් වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. 2021 මැයි 4 වැනි දින ජාතික තාක්ෂණික නියෝජිතායතනවල සහභාගීත්වයෙන් පාර්ශවකරුවන්ගේ රැස්වීම මාර්ගගත ක්‍රමය අනුව (ZOOM) පහසුකම භාවිතයෙන් අන්තර්ජාලය ඔස්සේ පවත්වන ලදී . තවද, 2021 මැයි 22 වැනි දින මාධ්‍යය ආයතන සහ පිරිස් දැනුවත් කිරීම සඳහා මාර්ගගත මාධ්‍යය හමුවක් පවත්වන ලදී . ආපදා කළමනාකරණ චක්‍රලේඛය නිරිතදිග මෝසම් කාලය තුළ ප්‍රතිචාර දැක්වීම සඳහා සැලසුම් කිරීම සහ සූදානම පිළිබඳ 2021 මැයි 13 දිනැති අංක: 01/2021 නිකුත් කර දිස්ත්‍රික් එකොළහකම දිස්ත්‍රික් ලේකම්වරුන් අතර බෙදා හරින ලදී.



මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම



ජාත්‍යන්තර මට්ටමින් පාර්ශවකරුවන් දැනුවත් කිරීම

2021 වර්ෂයේ ලෝක ආහාර සංවිධානයේ ආධාර ඇතිව ඊසාන දිග හා නිරිත දිග අන්තර් මෝසම් සමඟ ඇතිවිය හැකි වර්ෂාව නිසා සිදුවන ආපදා තත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා එය බලපාන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පෙර සූදානම් සැලසුම් සකස් කරනු ලබයි. COVID 19 වසංගතය හේතුවෙන් රට තුළ පවතින තත්වය සලකා බැලීම සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රෙගුලාසිවලට අනුකූල වීම, සුදුසු සූදානම, සැලසුම් කටයුතු හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක කාර්යයක් විය. දිස්ත්‍රික් මට්ටමෙන් දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් පෙර සූදානම් රැස්වීම් 18ක් හා ප්‍රාදේශීය පෙර සුදානම් රැස්වීම් 88ක් පවත්වන ලදි.

වගුව 4.3: දිස්ත්‍රික් පෙර සූදානම් රැස්වීම් පැවැත්වීම 2021

අංකය	දිස්ත්‍රික්කය	වෙන් කළ ප්‍රමාණය	සම්පූර්ණ කළ ප්‍රමාණය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	වියදම
1	කොළඹ	2	2	කොළඹ	39,940.00
				කොලොන්නාව	39,940.00
2	ගාල්ල	1	1	නෙළුව	29,970.00
3	ගම්පහ	3	1	ජා - ඇළ	31,250.00
			1	ගම්පහ	31,250.00
			1	මීගමුව	31,250.00

4	කෑගල්ල	3	1	බුලත්කොහුපිටිය	38,580.00
5	රත්නපුර	3	1	කුරුවිට	38,250.00
6	කුරුණෑගල	4	2	රිදීගම	40,000.00
				ගිරිබාව	40,000.00
7	පොළොන්නරුව	3	1	වැලිකන්ද	35,000.00
			1	තමන්කඩුව	35,000.00
8	අම්පාර	3	1	සමන්තුරෙයි	39,970.00
9	යාපනය	1	1	උඩුවිල්	39,515.00
10	මුලතිව්	1	1	ඔඩිඩුසුඩාන්	16,950.00
11	කළුතර	3	1	බුලත්සිංහල	40,000.00
			1	බදුරලිය	40,000.00
12	වවුනියාව	2	1	වවුනියාව	32,345.00
එකතුව		**18**			**639,210.00**

කොළඹ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු රැස්වීම කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මේජර් ප්‍රදීප් උදුගොඩ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විශ්‍රාමික මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ සහ දිස්ත්‍රික් ලේකම් ගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා පැවැත්විණි.



දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ශවකාර ආයතන සහභාගීත්වයෙන් නුවරඑළිය දිස්ත්‍රික් ආපදා පෙර සූදානම් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පසුගිය දා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පසුගිය දිනවල පැවැත්විණි.



පසුගිය දිනවල නුවර එළිය දිස්ත්‍රික්කයේ පැවැති අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් ඇති වූ ගංවතුර සහ නායයෑම් ආපදා අවම කරගැනීම සම්බන්ධයෙන් පවතින ගැටලු සහ ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව නුවර එළිය නගරාධිපති, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ අතිරේක දිස්ත්‍රික් ලේකම් ඇතුළු රාජ්‍ය නිලධාරීන් නුවර එළිය නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල හානියට පත්වූ නිවාස සහ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය කඩිනම් කිරීමේ අරමුණින් ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාවක් 2021.11.12 දින සිදුකරන ලදි.



<u>මානුෂීය ආයතනවලින් ආපදා ප්‍රතිචාර සඳහා දායකත්වය</u>

ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGOs), ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන (NGOs) සහ අනෙකුත් ස්වේච්ඡා ආයතන විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) සමඟ සම්බන්ධීකරණයෙන් සිදු කරන ලද ප්‍රතිචාර ක්‍රියාකාරකම් මගින් ක්ෂණික අවශ්‍යතා සපුරාලීම සඳහා සම්බන්ධීකරණ විය. නිරිත දිග මෝසම් වර්ෂාවෙන් පීඩාවට පත් ජනතාව තාවකාලික සහ අවතැන් වූවන් සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධාන ඇතුළු විවිධ මානුෂීය ආයතනවලින් ලැබුණු භාණ්ඩ, පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE), මාතෘ කට්ටල, ගරුත්වය සඳහා කට්ටල, වොෂ් බේසින් ආදිය ද තවත් සමහර රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන වියළි සලාක, පිසූ ආහාර ආදිය බෙදා හැරීමට සම්බන්ධ විය.



ලෝක ආහාර සංවිධානය පුද්ගලික ආරක්ෂක කට්ටල ලබා දීම



ඇමරිකානු එක්සත් රාජධානියේ තානාපති කාර්යාලය පුද්ගලික ආරක්ෂක කට්ටල ලබා දීම



ගර්භණී මාතාවන් සඳහා ගර්භණී මාතෘ කට්ටල හා කාන්තා සනීපාරක්ෂක කට්ටල ලබා දීම

4.1.5 පාසල් ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එක්ව ආපදා අවදානම් ඇති පාසල්වල පාසල් ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. 2021 වර්ෂයේ හම්බන්තොට, අම්පාර, යාපනය, මඩකලපුව හා මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි සුනාමි ආපදාවන්ට පාත්‍රවන පාසල් 10ක් මූලික කරගනිමින් මෙම වැඩසටහන් පවත්වන ලදි. මෙම වැඩසටහන් මඟින් පාසල් ළමුන් හා ගුරුවරුන් සමඟ මෙම පාසලේ ආපදා සිතියම් සකස් කිරීම්, ආපදා පිළිබඳ දැනුවත් කිරීම් සහ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මෙහි අරමුණ වේ.

4.1.6 රෝහල් පෙර සූදානම් වැඩසටහන් පැවැත්වීම

රෝහල් හදිසි ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ රෝහල් සේවක සේවිකාවන්ගේ ආරක්ෂාව, රෝගීන්ගේ ආරක්ෂාව, හදිසි ආපදා අවස්ථාවකදී රෝහල් කරා එන රෝගීන්ට ප්‍රතිකාර කිරීම හා ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා සැලසුම් සැකසීම වේ. මෙම වැඩසටහන තුළ දී රෝහල තුළ හා අවට ප්‍රදේශවල ස්වභාවික ආපදාවලට ඇතිවන ආපදා හඳුනාගෙන එම තොරතුරු සිතියම්ගත කර ඒ අනුව එම ආපදා අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම, දැනුවත් කිරීම් හා පෙර සූදානම් වැඩසටහන් පැවැත්වීම පිළිබඳව තොරතුරු ඇතුළත් සැලැස්මක් සකස් කිරීමයි. මෙම වැඩසටහන් යටතේ 2021 වර්ෂයේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩසටහන් 05ක් පවත්වන ලදි. ඒ සඳහා 109,450.00ක් වියදම් දරන ලදි.

වගුව 4.4: රෝහල් පෙර සූදානම් වැඩසටහන් - 2021

	දිස්ත්‍රික්කය	වෙන් කළ වැඩසටහන් ප්‍රමාණය	සම්පූර්ණ කළ වැඩසටහන් ප්‍රමාණය	ස්ථානය	දිනය	වියදම	සහභාගීවූවන් ගණන
1	බදුල්ල	5	5	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	2021/3/29	109,450.00	60
එකතුව						**109,450.00**	

4.1.7 ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන - IOWave 20

ඉන්දියාවේ හයිද්‍රබාද් හි 2011 පෙබරවාරි මස 10 – 11 දිනවලදී ඉන්දියානු සාගර සුනාමි පූර්ව අනතුරු ඇඟවීම් හා අවම කිරීමේ පද්ධතිය (ICG / IOTWMS) සමඟ පැවැත්වූ රැස්වීමේ දී, සුනාමි සේවා සපයන්නන් (TSPs) හා ජාතික සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ ආයතන (NTWCs) අතර නිරන්තර සන්නිවේදන පරීක්ෂණ සිදුකල යුතු බව තීරණය කෙරිණි. IOTWMS ක්‍රියාකාරී කණ්ඩායම් 2 වෙනුවෙන් සුනාමි අනතුරු ඇඟවීම හා දැනුම්දීමේ 22 වන IOTWMS සන්නිවේදන පරීක්ෂාව 2021 ජුනි 09 වන දිනත් 23 වන දිනත් IOTWMS සන්නිවේදන පරීක්ෂාව 2021 දෙසැම්බර් මස 8 වන දිනත් පවත්වන ලදි. ජාතික සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය (NTWC) වශයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් හඳුනාගෙන ඇති සන්නිවේදන මාධ්‍යන් (GTS, Fax, Email and SMS) භාවිතා කරමින් සන්නිවේදන පරීක්ෂාව සිදුකර ඇත. මෙම අභ්‍යාසයේ දී IOTWMS හි සුනාමි සේවා සපයන්නන් (TSPs) තිදෙනෙකු විසින් සුනාමි බුලටින් හතරක් ජාතික සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය (NTWC) වෙත යවන ලද අතර ඉන්පසු ජාතික සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය (NTWC) මඟින් භූගත සුනාමි බුලටින් තොරතුරු ලැබීම පිළිබඳ වාර්තා කරන ලදි.

ශ්‍රී ලංකාවේ ජාතික ආපදා කළමනාකරණ සංවිධානය (NDMO) වශයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සුනාමි බුලටින් දැනුම් දීමේ ක්‍රියාවලියෙහි ඵලදායීතාව ඇගයීමට හා ඉදිරි වැඩිදියුණු කිරීම් සඳහා අඩුපාඩු හඳුනාගැනීමට නිර්මාණය කරනලද සියළු බුලටින් වර්ග හතරක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරිය වෙත එවන ලෙස ජාතික සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය වෙත ඉල්ලුම් කර ඇත.




එසේම සුනාමි අනතුරු ඇඟවීම් සහ ප්‍රතිචාර යාන්ත්‍රණය බිම් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ දී පවතින ප්‍රායෝගික දුෂ්කරතා පිළිබඳව සහ වත්මන් කොවිඩ්-19 වසංගතය සැලකිල්ලට ගනිමින් අනුගමනය කළ යුතු විශේෂ සෞඛ්‍යාරක්ෂිත ක්‍රියාමාර්ග ඇතුළුව වත්මන් සුනාමි පෙරසූදානම හා සැලසුම්, සුනාමි පෙරසූදානම් වැඩසටහන්, ප්‍රතිචාර යාන්ත්‍රණ සහ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩිදියුණු කිරීම පිළිබඳවත් අවධානය යොමු කරන ලදී.

4.1.8 සුළඟේ වේගය අනුමාන කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ පෝස්ටර්

බෝෆට් පරිමාණයට අනුකූලව අභ්‍යන්තර හා වෙරළ ආසන්නයේ සුළඟේ වේගය මඟින් ඇතිවිය හැකි බලපෑම් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ දැනුවත් කිරීමේ පෝස්ටර් සිංහල, දෙමළ හා ඉංග්‍රීසී මාධ්‍යයෙන් දිස්ත්‍රික්ක කාර්යාල වෙත බෙදා දීමට කටයුතු කරන ලදී. මේ සඳහා තාක්ෂණික සහයෝගය **JICA** සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබා දුනි. මූල්‍ය ආධාර **ADPC** ආයතනයෙන් ලබා දෙන ලදී.





4.1.9 සුරක්ෂිත මධ්‍යස්ථාන සඳහා ක්ෂේත්‍ර ඇඳන් බෙදාදීම

හදිසි අවශ්‍යතාවයක් ලෙසට නිරිතදිග මෝසම් තත්වයට බලපාන දිස්ත්‍රික්වල ඇති සුරක්ෂිත මධ්‍යස්ථාන සඳහා ලෝක බැංකු ආධාර ඇතිව ක්ෂේත්‍ර ඇඳන් (Foldable bed) 1000ක් (මෙට්ට සහිත) මිලට ගන්නා ලදි. මේ සඳහා ලෝක බැංකුව රු. මිලියන 11.87ක් වෙන්කර ඇත. මෙම මිලට ගන්නා ඇඳන් දිස්ත්‍රික්කයන්හි පවතින ආපදා තත්වය හා සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව අනුව දිස්ත්‍රික්කවලට බෙදා හැරීමට කටයුතු සිදුකරමින් පවතී.

4.1.10 ප්‍රගති සමාලෝචන රැස්වීම්

ආපදා කළමනාකරණ අමාත්‍යාංශ අතිරේක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2021.07.26 සහ 2021.11.01 දෙදිනයන් ප්‍රගති සාලෝචන රැස්වීම් පවත්වන ලදි.

යාපනය, මුලතිව්, කිළිනොච්චි, වවුනියාව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, මන්නාරම, මොණරාගල සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන් සමඟ 2021.01.26 දින මාර්ගගත ක්‍රමය (Zoom) ඔස්සේ දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වන ලදි.

එමෙන්ම 2021.01.27 දින අනුරාධපුර, කොළඹ, බදුල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, නුවර එළිය, පොළොන්නරුව, පුත්තලම සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන්වල ද මාර්ගගත ක්‍රමය (Zoom) ඔස්සේ දිස්ත්‍රික් ප්‍රගති සාමාලෝචන රැස්වීම පවත්වන ලදි.





4.1.11 වර්තමාන ආපදා තත්වය හමුවේ සහන සැලසීම පිළිබඳ සාකච්ඡාව

වර්තමාන ආපදා තත්වය හමුවේ සහන සැලසීම පිළිබඳ සාකච්ඡාවක් ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2021.11.16 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී පවත්වන ලදි. මෙහිදී ගෝලීය වශයෙන් සිදුව ඇති කාලගුණ විපර්යාස හේතුවෙන් රට තුළ උද්ගතව ඇති ආපදා තත්වයන් පිළිබඳවත් එමඟින් අගතියට පත්ව ඇති ජනතාව හා ප්‍රදේශ සඳහා සහන ලබාදීම පිළිබඳවත් මහජන නියෝජිතයන් හා රාජ්‍ය නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමේ අරමුණ පෙරදැරිව මෙම සාකච්ඡාව පවත්වන ලදි.
මෙම සාච්ඡාව සඳහා ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුලුව අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් සහ ආයතන ප්‍රධානීන් සහභාගී විය.

4.2 පුහුණු හා දැනුවත් කිරීමේ අංශය

ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුහුණු හා දැනුවත් කිරීම් අංශය වෙත පැවරී ඇති වගකීම වන්නේ ඇතිවිය හැකි ආපදා පිලිබඳවත්, ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිලිබඳවත්, ආපදා සඳහා මහජනතාව සූදානම් කිරීම පිලිබඳවත් ඒ සඳහා මහජනතාවගේ දායකත්වය ලබා ගැනීම සඳහා වන දැනුම හා අවබෝධය මෙන්ම අත්දැකීම් ද ලබා දීමට හැකි වන පරිදි පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්, අත්පත්‍රිකා, පෝස්ටර්, බැනර්, ප්‍රදර්ශන, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් තොරතුරු මහජනතාව වෙත ලබා දීම යනාදී ක්‍රියාකරකම් හරහා රටේ මහජනතාවගේ දැනුවත්භාවය වැඩිකර ඇති විය හැකි ව්‍යසන තත්වයන් කාර්යක්ෂමව කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කිරීම ප්‍රධානතම අරමුණ වේ. වර්තමානයේ පවතින ගෝලීය උණුසුම, කාලගුණික හා දේශගුණික විපර්යාසයන්, ජනගහන වර්ධනය, අවධිමත් සංවර්ධන ක්‍රියාකාරකම් මෙන්ම නොයෙකුත් ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ආපදා අවදානම් තීව්‍ර වෙමින් පවතින අතර ආපදා නිසා ඇතිවන ජීවිත හා දේපළ විනාශය ද වැඩිවෙමින් පවතී. මෙවැනි තත්වයන් තුළ තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලගා වීමට ද ප්‍රබල බාධකයක් වී ඇත. එබැවින් රටේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 2021 වර්ෂයේ


සැලසුම් කර තිබුණි. 2021 වර්ෂයේ අප රට තුළ පැවති කෝවිඩ් -19 වසංගත තත්වය හමුවේ සෞඛ්‍ය අමාත්‍යාංශ විසින් කලින් කලට ප්‍රකාශයට පත් කරන ලද නීතිරීති හා රෙගුලාසි අනුව 2021 වර්ෂයේ සැළසුම් කල වැඩසටහන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් මහජන සහභාගීත්වයෙන් සිදු කල යුතු බැවින් ඉහත සඳහන් සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ජනතාව ඒකරාශී කර වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. කෙසේ වෙතත් 2021 වර්ෂය තුළ කෝවිඩ්- 19 වසංගත තත්වයන් පිළිබඳව පැවති නීතිරීති ලිහිල් වූ විට සීමිත ජන සහභාගීත්වයකින් යුතුව පුහුණු හා දැනුවත් කිරීමේ වැසටහන් ක්‍රියාත්මක කල අතර මේ සඳහා රු. මිලියන 9.4කට ආසන්න මුදලක් වැය කරමින් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පමණක් 197ක් ක්‍රියාත්මක කල අතර ඒ සඳහා සෘජු ප්‍රතිලාභීන් ලෙස 11,530ක් සහභාගී වී ඇත. ඒ අනුව සිදු කරන ලද ජාතික මට්ටමේ සහ දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

4.2.1 ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

<u>ආපදා පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා පොත් කට්ටල මුද්‍රණය කිරීම</u>

රටේ වැඩිවෙමින් පවතින ආපදා අවදානම් ක්‍රියාවලිය පිළිබඳව පාසල් සිසුන්ගේ දැනුම හා අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා ගංවතුර, සුනාමි, භූමිකම්පා, ප්‍රථමාධාර, අකුණු, නායයෑම් සහ නියඟය යන ආපදා සම්බන්ධයෙන් එක් පොත බැගින් පොත් 7කින් සමන්විත කට්ටලයක් සකස් කර මුද්‍රණය කිරීමට පියවර ගන්නා ලදි. මෙම පොත් කට්ටල 2010 වර්ෂයේදී ද මුද්‍රණය කර සියලුම පාසල් පුස්තකාල වෙත ලබා දීමට කටයුතු කල අතර පාසල් ප්‍රජාවගේ ඉල්ලීම පරිදි ලෝක ආහාර වැඩසටහනේ මූල්‍ය ප්‍රතිපාදන යොදා ගෙන 2021 වර්ෂයේ පොත් කට්ටල 500ක් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදි.



ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳව මුද්‍රණය කරන ලද පොත් වර්ග

4.2.2 ප්‍රදර්ශන හරහා මහජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන කට්ටල නිර්මාණය කිරීම

ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටම්න් සහ පාසල්වල පැවැත්වෙන විවධ වූ ප්‍රදර්ශන තුළ භාවිතා කිරීම සඳහා ප්‍රදර්ශන කට්ටල දිස්ත්‍රික්ක 07ක් 2021 වර්ෂයේ නිර්මාණය කරන ලදි. මෙම ප්‍රදර්ශන කට්ටල මගින් අපේක්ෂා කරනු ලබන්නේ ආපදා පිළිබඳවත්, ආපදා කළමනාකරණ යාන්ත්‍රණය පිළිබඳවත්


මහජනතාව ක්‍රියා කල යුතු ආකාරය පිලිබඳවත් ඉතා සරලව රූප රාමු සහිතව නිවැරදි අවබෝධය ලබා දෙමින් මහජනතාව ආපදා කළමනාකරණ ක්‍රියාවලියට සූදානම් කිරීම සහ ඔවුන්ගේ ජීවිත හා දේපල සුරක්ෂිත කිරීමයි.

වගුව 5.1: 2021 වර්ෂයේ ප්‍රදර්ශන කවටල ලබා දුන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සහ උපාංග විස්තරය

දිස්ත්‍රික්කය	අයිතමය						
	පහසුවෙන් හැසිරවිය හැකි ප්‍රධාන නාම පුවරු	ඉහල පහල නැමිය හැකි නාම පුවරු	ප්‍රදර්ශන කවුළු	හැකිලිය හැකි පුටු	සුනාමි කුළුනේ ආකෘති	විදුලි පංකා	කාපට්
කොළඹ	01	03	01	02	01	01	01
කළුතර	01	03	01	02	01	01	01
අම්පාර	01	03	01	02	01	01	01
මන්නාරම	01	03	01	02	01	01	01
වවුනියාව	01	03	01	02	01	01	01
නුවරඑළිය	01	03	01	02	01	01	01
මුලතිව්	01	03	01	02	01	01	01
එකතුව	**07**	**21**	**07**	**14**	**07**	**07**	**07**







පහසුවෙන් හැසිරවිය හැකි ප්‍රධාන නාම පුවරු, ඉහල පහල නැමිය හැකි පුවරු , ප්‍රදර්ශන කවුළු ආදී උපාංග

4.2.3 ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳව ගෝලීය වැඩසටහන් සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම සඳහා පුවරු නිර්මාණය කිරීම

ගෝලීය උණුසුම සහ කාලගුණික හා දේශගුණික විපර්යාස හා අනෙකුත් විවධ වූ ස්වභාවික හා මානව ක්‍රියාකාරක්ම් හේතු කොට ගෙන ගෝලීය වශයෙන් විවිධ වූ ආපදා තත්වයන් තීව්‍ර වෙමින් පවතින අතර එවැනි තත්වයන් කළමනාකරණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ ක්‍රියාත්මක ගෝලීය වැඩසටහන් වන ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්දායි රාමුව 2015-2030 (Sendai

Framework for Disaster Risk Reduction 2015-2030) සහ තිරසාර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals) යන වැඩසටහන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් 2ක් වන අතර එම වැඩසටහන් දෙකෙහි ක්‍රියාකාරීත්වය තුළ ගෝලීය වශයෙන් මෙන්ම කලාපීය වශයෙන් හා ජාතික මට්ටමින් ආපදා අවදානම් ක්‍රියාවලියට දායකවන වැඩසටහන් දෙකෙහී මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳ පුවරු සකස් කර ඒවා දිස්ත්‍රික් කාර්යාල තුළ ප්‍රදර්ශනය කිරීමට සලස්වන ලදි.



සකස් කරන ලද ආලෝක පුවරු

4.2.4 සම්පත් මධ්‍යස්ථානය සඳහා (පුස්තකාලය) පොත් මිලදී ගැනීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇති සම්පත් මධ්‍යස්ථානය (පුස්තකාලය) සඳහා 2021 වර්ෂයේ රු. 641,571.00ක් වටිනා ආපදා කළමනාකරණයට අදාළ නව දැනුම ලබා ගැනීමට හැකි වන පරිදි පොත් හා පර්යේෂණ ග්‍රන්ථ මිළදී ගන්නා ලදි. ඒ අනුව සිංහල මාධ්‍යයෙන් පොත් 585ක් ද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පොත් 22ක් ද, මාසික සඟරා 24ක් ද, මිළදී ගන්නා ලදි.

ආපදා කළමනාකරණ මධයස්ථානයේ සම්පත් මධ්‍යස්ථානය (පුස්තකාලය) ආචාර්ය උපාධී අපේක්ෂකයන්, පශ්චාත් උපාධි අපේක්ෂකයන්, විශ්ව විද්‍යාල සිසුන්, පාසල් සිසුන් ඇතුළු විවිධ අධ්‍යයන කටයුතුවල නිරත පිරිස් මෙම සම්පත් මධ්‍යස්ථානය පරිහරණය කරන අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් සම්පාදනය කර තිබේ.

4.2.5 පාර්ශවකාර ආයතන නිලධාරීන් ජාතික මට්ටමින් පුහුණු කිරීම

ආපදා කළමනාකරණ ක්‍රියාවලිය හුදකලා ක්‍රියාවලියක් නොවන අතර එය රටේ පවතින නීතිරීති හා රෙගුලාසි අනුව විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ ත්‍රිවිධ හමුදාව පොලීසිය ඇතුළු විවිධ ආයතන වෙත ආපදා කළමනාකරණය පිළිබඳ වගකීම් පැවරී ඇත. ඒ අනුව ආපදා කළමනාකරණ ක්‍රියාවලියේ වගකීම් පැවරී ඇති එම ආයතන නිලධාරීන් සඳහා දැනුම් අවබෝධය හා අත්දැකීම් ලබා දීම සඳහා 2021 වර්ෂයේ ද විවිධ වූ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව එම වැඩසටහන් පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

වගුව 5.2: 2021 වර්ෂයේ සිදුකරන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

අනු අංකය	ඉලක්කගත කණ්ඩායම / දැනුවත් කිරීමේ වැඩසටහන	සහභාගී වූ සංඛ්‍යාව
01	ශ්‍රී ලංකා යුධ හමුදා නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	135
02	ශ්‍රී ලංකා යුධ හමුදා නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	65
03	ශ්‍රී ලංකා යුධ හමුදා නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන (ගම්පල යුධ හමුදා පුහුණු පාසල)	160
04	ත්‍රිවිධ හමුදාව ,පොලීසිය හා අනෙකුත් තාක්ෂණික ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන (“Boots on Ground” ඒකාබද්ධ අභ්‍යාස පෙරහුරු වැඩසටහන)	20
05	ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- (මොරවැව ගුවන් හමුදා නිලධාරීන්)	35
06	ශ්‍රී ලංකා යුධ හමුදා ආපදා පුහුණු මධ්‍යස්ථාන නිලධාරීන් (ගම්පල) සඳහා හදිසි මෙහෙයුම් මැදිරි නිරීක්ෂණ චාරිකා වැඩසටහන	136
	එකතුව	**551**




ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා යුධ හමුදා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන

4.2.6 ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන

දිස්ත්‍රික් මට්ටමින් හදිසි ආපදා කටයුතුවල නිරත ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් දින 04ක නේවාසික පුහුණු වැඩසටහනක් පැවැත්වූ අතර එහිදී න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම අවබෝධය හා අත්දැකීම් ලබා දීමට හැකි වූ අතර ඒ තුළින් දිස්ත්‍රික් මට්ටමේ හදිසි ආපදා තත්වයන් කළමනාකරණය කාර්යක්ෂම කිරීම අපේක්ෂා කෙරේ.




ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන

4.2.7 පාසල් විෂය මාලාවේ විෂය බාහිර ක්‍රියාකාරකම් තුළ ආපදා අවදානම් කළමනාකරණය අනුගත කිරීමේ ජාතික වැඩසටහන

වර්තමානයේ විවිධ වූ ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා සිදු වන ආපදාවල අවදානම් තීව්‍ර වෙමින් පවතින අතර සිදු වන ජීවිත හා දේපල විනාශය ද වැඩිවෙමින් පවතී. එමෙන්ම ආපදාවල ස්වභාවය ද සංකීර්ණ වෙමින් පවතී. මේ තත්වයට මුහුණ දීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය රටේ විවිධ වූ කණ්ඩායම් ඒ සඳහා දායක කර ගනිමින් මහජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කිරීම වෙනුවෙන් කටයුතු කරනු ලබයි.

අධ්‍යාපන අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය, ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය, ශ්‍රී ලංකා ශිෂ්‍යභට බලකාය යන ආයතන 04 ඒකාබද්ධ වී ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පාසල් විෂය මාලාවේ බාහිර ක්‍රියාකාරකම් තුළ අනුගත කිරීම සහ ජාතික බාලදක්ෂ සංගමයේ, ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ සහ ශ්‍රී ලංකා ශිෂ්‍යභට බලකායේ, දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් නිරත වන සියලු නිලධාරීන් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳව පුහුණුකර ඔවුන් ආපදා කළමනාකරණ ක්‍රියාවලියේ සක්‍රීයව දායක වන කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට හැකි වන පරිදි ජාතික වැඩසටහනක් 2021 වර්ෂයේ ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදි.

4.2.8 බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය මඟින් අඩු ආදායම්ලාභී 100,000ක් වෙත වෘත්තීය පුහුණුව ලබා දීමේ ජාතික වැඩසටහන

‘‘සෞභාග්‍ය දැක්ම’’ ප්‍රතිපත්තිය යටතේ ස්ථාපිත කරන ලද යෝජිත බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය තුළ ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා තෝරා ගෙන සිටින සහාකයින් පුහුණු කර ගැනීම සඳහා 2020 වර්ෂයේ සකස් කරන ලද පුහුණු මොඩියුලය අනුව 2021 වර්ෂයේ දිස්ත්‍රික් මට්ටමින් එම පුහුණු වැඩසටහන සඳහා තාක්ෂණික සහයෝගය ලබා දෙමින් අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම පුහුණු වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද අතර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක එම වැඩසටහන් මෙහෙය වූ අතර වැඩසටහන් සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් හා උපදෙස් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැනුවත් කිරීම් අංශය විසින් ලබා දෙන ලදි.



හෙද සහායක නිලධාරීන් සඳහා ආපදා කළමනාතරණ පුහුණුව ලබා දීම- හම්බන්තොට දිස්ත්‍රික්කය

4.2.9 මාධ්‍ය සාකච්ඡා සහ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ ආපදා අවදානම් තත්වයන් පිළිබඳ සියලු තොරතුරු මහජනතාව වෙත ගෙන යන වේගවත්ම මාධ්‍ය වන්නේ ජන මාධ්‍යයි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මේ සඳහා මාධ්‍යවේදීන් පුහුණු කිරීම, දැනුවත් කිරීම සහ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම නිරන්තරයෙන් සිදු කරනු ලබයි. මෙම සාකච්ඡා පවත්වනු ලබන්නේ හදිසි ආපදා තත්වයන් කළමනාකරණ ක්‍රියාවලියට දායක වන ප්‍රධාන පාර්ශවකාර ආයතන ප්‍රධානීන් හෝ එම ආයතනවල නියෝජිතයින් සමඟ සිදු කරන අතර එහිදී ඇති විය හැකි ආපදා තත්වයන් මෙන්ම එම ආපදා තත්වයන් සඳහා වූ පූර්ව සූදානම් පිළිබඳ ද දීර්ඝ ලෙස සාකච්ඡාවට බඳුන් වේ.



මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම

4.2.10 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල හරහා මහජනතාවට තොරතුරු දැනුවත් කිරීම

ආපදා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම සහ මහජනතාව දැනුවත් කිරීම සම්බන්ධ පූර්ව නිවේදන සහ තොරතුරු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළ වෙබ් අඩවි හරහා සිදු කෙරේ. ඊට අමතරව ප්‍රසිද්ධ සමාජ මාධ්‍ය ජාල යාවත් කාලීන කිරීම දැනුවත් කිරීමේ අංශ යටතේ පවතින මාධ්‍ය අංශය විසින් සිදු කරනු ලබයි. විශේෂයෙන්ම හදිසි ආපදා තත්වයක දී දත්ත සහ තොරතුරු ක්ෂණිකව මාධ්‍ය වෙත ලබාදීම, ජාතික සහ ජාත්‍යන්තර ආයතන දැනුවත් කිරීම සඳහා අවශ්‍ය දත්ත යාවත්කාලීන කිරීම දෛනිකව සිදු කරනු ලබයි.

4.2.11 ජාතික සුරක්ෂිත දින වැඩසටහන

2004 වර්ෂයේ සුනාමි ව්‍යසනය හමුවේ අප මාතෘභූමියට ජීවිත 35,000කට වඩා අහිමි වූ අතර බිලියන ගණනක් වටිනා දේපළ ද අහිමි විය. 2004 දෙසැම්බර් මස 26 දින ශ්‍රී ලංකාවට බලපෑ මෙම සුනාමි තත්ත්වයෙන් මියගිය ජනතාව සිහිපත් කරවීම පිණිස දීප ව්‍යාප්ත සර්ව ආගමික වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙසැම්බර් 26 වන දින ජාතික සුරක්ෂිත දිනයට හා ඊට සමගාමීව පැවැත්වීමට කටයුතු කරන ලදී.

ඒ අනුව 2021 වර්ෂයේ පැවති අභියෝග හමුවේ වුව ද දෙසැම්බර් මස 26 වන දින සුනාමි ව්‍යසනයෙන් සහ අනෙකුත් ව්‍යසනයන්ගෙන් මිය ගිය ජනතාව සිහිපත් කරමින් පිං පැමිණවීම සඳහා සර්ව ආගමික

වැඩසටහන්වලට මුල්තැන දෙමින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක 25 කේන්ද්‍රකර ගෙන රාජ්‍ය නිලධාරීන් සහ මහජනතාවගේ ද සහභාගිත්වයෙන් සර්ව ආගමික වැඩසටහන් පවත්වා මියගිය ජනතාවට පිං පැමිණෙවීම සිදු කරන ලදි. එහිදී ජාතික සුරක්ෂිත දින ප්‍රධාන වැඩසටහන ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන්, ත්‍රිවිධ හමුදාව, පොලිසිය, රාජ්‍ය නිලධාරීන් සහ මහජනතාව ද සම්බන්ධ කරගෙන හික්කඩුව පැරැලිය සුනාමි ස්මාරකය අසල දී පැවැත්විණි.




සුරක්ෂිතා දින උත්සවය හික්කඩුව, පැරැලිය සුනාමි ස්මාරකය




ජාතික සුරක්ෂිතා දින සැමරුම් උත්සවය, හම්බන්තොට බස් නැවතුම්පොල ඉදිරිපිට -හම්බන්තොට දිස්ත්‍රික්කය

4.2.12 දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආපදා කළමනාකරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා සියලුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක ස්ථාපිත කර ඒ සඳහා අවශ්‍ය කරන සියලුම මානව සම්පත්, භෞතික සම්පත් හා මූල්‍ය සම්පත් ලබා දෙමින් දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික්කයේ සියලුම පාර්ශවකාර ආයතන හා මහජනතාව, ප්‍රජාව සම්බන්ධීකරණ කරමින් දිස්ත්‍රික් මට්ටමින් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලබයි.

දිස්ත්‍රික් ආපදා සම්බන්ධීකරණ ඒකක විසින් දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාමීය මට්ටමේ සියලු පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම අත්පත්‍රිකා, පෝස්ටර්, බැනර් නිර්මාණය කර බෙදා හැරීම දිස්ත්‍රික් මට්ටමේ මාධ්‍ය වැඩමුළු ඇතුළු සියලු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ඔවුන් විසින් සිදු

කරනු ලබයි. මෙම වසරේ දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් 191ක් පැවැත්වූ අතර මේ සඳහා 10979ක පිරිසක් සහභාගී විය.

ඒ අනුව 2021 වර්ෂයේ දිස්ත්‍රික් කාර්යාල විසින් වැඩසටහන් 191 පවත්වා 10979 දෙනෙකු පුහුණු කර ඇත.



ප්‍රජා නායකයන් සඳහා කළුතර නාවික හමුදා කඳවුරේ පැවති බෝට්ටු ක්‍රියාකරවීම පිළිබඳ පුහුණු වැඩසටහන - කළුතර දිස්ත්‍රික්කය



පරිවාස හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය- මහනුවර දිස්ත්‍රික්කය



පොලිස් නිලධාරීන් සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - බදුල්ල දිස්ත්‍රික්කය



කෘෂිකර්ම දෙපාර්තමේන්තු තාක්ෂණික නිලධාරීන් සඳහා පවත්වන ලද ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - කිළිනොච්චිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

4.2.13 අත් පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම

රත්නපුර දිස්ත්‍රික්කය වාර්ෂිකව ගංවතුර, නායයෑම් වැනි ආපදාවලට මුහුණ දෙන දිස්ත්‍රික්කයක් වන අතර ඉන් පීඩාවට පත් වන සංඛ්‍යාව අති විශාල ය. ආපදාවලට ගොදුරු විය හැකි ජනතාව හඳුනා ගෙන පවතින ආපදා අවදානම් තත්වයන් පිළිබඳවත්, එවැනි ආපදා තත්වයන්වලදී ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය පිළිබඳවත් ඉතා සරලව මහජනතාව දැනුවත් කිරීම සඳහා අත් පත්‍රිකාවක් සකස් කර ගෙයින් ගෙට ගොස් බෙදා දෙන ලදි.



රත්නපුර දිස්ත්‍රික්කය සඳහා නිර්මාණය කරන ලද අත්පත්‍රිකා

4.2.14 දිස්ත්‍රික් මට්ටමේ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ ප්‍රධාන පාර්ශවකාර ආයතනයක් ලෙස මාධ්‍ය ආයතන කටයුතු කරන අතර නිරන්තරයෙන් මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සිදු කල යුතුය. ඒ අනුව 2021 වර්ෂයේ දිස්ත්‍රික් මට්ටමින් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පැවැත්වූ අතර ඒ පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.

වගුව 5.3: 2021 වර්ෂය තුළ පැවැත්වූ දිස්ත්‍රික් මාධ්‍යවේදී දැනුවත් කිරීමේ වැඩමුළු

අංකය	දිස්ත්‍රික්කය	සහභාගී වූ ප්‍රාදේශිය මාධ්‍යවේදීන් සංඛ්‍යාව
1	යාපනය	40
2	මොනරාගල	35
3	හම්බන්තොට	60
එකතුව		135



දිස්ත්‍රික් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුළු - හම්බන්තොට දිස්ත්‍රික්කය

4.2.15 කාර්යය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන්

පවතින ආපදා අවදානම් මෙන්ම අනාගතයේ නිර්මාණය විය හැකි ආපදා අවදානම් තත්ත්වයන් කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කිරීම

සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියලු නිලධාරීන් හට නවීන තාක්ෂණික දැනුමින් යුත් කුසලතා වර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වාර්ෂිකව කාර්යය මණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධන වැඩසටහනේ විස්තර පහත සඳහන් වේ.

වගුව 5.4: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධන වැඩසටහනේ විස්තර

	වැඩසටහන	**සහභාගී වූ ප්‍රමාණය**
01	නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පැවැත්වූ ලිපිගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	30
02	විෂයානුබද්ධ කෙටිකාලීන පාඨමාලා සඳහා කාර්යය මණ්ඩලය යොමු කිරීම	03
03	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අනුයුක්ත නවක ත්‍රිවිධ හමුදා නිලධාරීන් සඳහා හඳුන්වාදීමේ වැඩසටහන	07
04	බ්‍රිතාන්‍ය කවුන්සලය මගින් පවත්වනු ලැබූ ඉංග්‍රීසි පාඨමාලාව	25
05	කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම	60
එකතුව		**125**





බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනය සම්පත් දායකත්වය යටතේ පවත්වනු ලැබූ ඉංග්‍රීසි භාෂා පාඨමාලාව

4.3 අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

මහා භාණ්ඩාගාරය මගින් පහත සඳහන් පරිදි 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය වෙත වෙන්කරන ලද අතර අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මගින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ආපදා හඳුනාගැනීම සහ දිස්ත්‍රික් මට්ටමේ අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම, ආපදා කළමනාකරණ කටයුතු සඳහා පර්යේෂණ දායකත්වය ලබාදීම සහ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම යන වැඩසටහන් සඳහා ප්‍රමුඛස්ථානය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වගකීම් සහ කාර්යභාරය ඉටුකිරීමට දායකත්වය ලබාදෙනු ලැබේ.

ඒ අනුව 2021 වර්ෂයේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා මූල්‍ය සහ භෞතික ප්‍රගති සාරාංශය පහත පරිදි වේ.

වගුව 6.1: 2021 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

වැය ශීර්ෂය	ව්‍යාපෘතිය	**2021** වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන (රු. මී.)	මූල්‍ය ප්‍රගතිය (රු. මී.)	භෞතික ප්‍රගතිය (%)
3-2509	ආපදා අවමකිරීමේ ව්‍යාපෘති	350	157.65	75
10-2509	ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම	08	1.68	55
7-2509	ආපදා අවදානම් තක්සේරුව	10	0.18	55

4.3.1 ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව තුළ ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ ප්‍රධානතම කාර්යයක් වන අතර එහිදී එක් එක් වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන කළමනාකරණය කරමින් ආපදා අවමකිරීමේ ව්‍යාපෘති යෝජනාවල ප්‍රමුඛතා ගතකිරීම අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. මෙහිදී විවිධ වූ ආපදා අවම කිරීමේ වැඩසටහන් ඊට අදාළ රේඛීය අමාත්‍යාංශය මගින් එම අමාත්‍යාංශ සතු ප්‍රතිපාදන මගින් සිදුකරගැනීම සඳහා යොමු කෙරෙන අතර ප්‍රමුඛතාවය මත අනෙකුත් ආපදා අවම කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබයි. ආපදා පිළිබඳ තොරතුරු සහ දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කරන ලද යෝජනා පදනම්කර ගනිමින් ඉදිරිපත් කරන ලද අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 350ක් 2021 වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරය මගින් අනුමත කොට ඇත. 2021 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට උක්ත ප්‍රතිපාදන දිස්ත්‍රික් 22ක ව්‍යාපෘති 59ක් සඳහා යොමුකරන ලද අතර දිස්ත්‍රික් මට්ටමින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ටෙන්ඩර් කැඳවීම් සිදුකිරීම, ටෙන්ඩර් ප්‍රදානය කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. විවිධ හේතූන් මත අවලංගු වූ ව්‍යාපෘති නව ව්‍යාපෘති දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කරන ලද අතර එයින් කිහිපයක් සඳහා අනුමැතිය පලකරන ලදී. 2021 වර්ෂය තුළ ව්‍යාපෘති 16ක් අවලංගු විය. ඒ අනුව 2021 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘති 40ක් භෞතිකව අවසන් කර ඇති අතර ව්‍යාපෘති 10ක් 2022 වසර සඳහා අවිච්ඡේද කරන ලෙස අනුමැතිය ඉල්ලා ඇත. අවිච්ඡේද කිරීමට අනුමැතිය ඉල්ලා ඇති ව්‍යාපෘතිවල වටිනාකම රුපියල් මිලියන 69.93ක් වේ.

සමස්ත අවම කරන ව්‍යාපෘතිවල රුපියල් මිලියන 157.65ක වියදමක් 2021 වසර තුළ වාර්තා කරන අතර මුදල් ගෙවීමට නොහැකිවූ අතැති බිල්පත්වල වටිනාකම රුපියල් මිලියන 45.88ක් වේ. ඒ අනුව සමස්ත ව්‍යාපෘතිවල භෞතික ප්‍රගති 75%ක් වන අතර අතැති බිල්පත් හැර මූල්‍ය ප්‍රගතිය 45%ක් වේ. අතැති බිල්පත් සහිතව මූල්‍ය ප්‍රගතිය 58%ක් වේ. කොවිඩ් 19 ලෝක වසංගතය හේතුවෙන් උක්ත ව්‍යාපෘතිවල ප්‍රගතිය සඳහා සෘජුවම බලපෑම් සිදුවූ අතර භූමිය තුළ සිදුකෙරෙන ක්‍රියාකාරකම් සිදුකිරීමට මූලික තාක්ෂණික කටයුතු සිදුකිරීමේ සිට ටෙන්ඩර් කැඳවීම ඇතුළු සියලු අවස්ථාවන්හිදී විවිධ

දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවිය. එකම ව්‍යාපෘතිය සඳහා නැවත නැවත ඇස්තමේන්තු සැකසීමේ සිට නැවත ටෙන්ඩර් කැඳවීම දක්වා ක්‍රියාදාමය සිදුකිරීමට සිදුවීම හේතුවෙන් ව්‍යාපෘති ආරම්භය සඳහා අනපේක්ෂිත කාලයක් වැයවීම ද ප්‍රධාන අභියෝගයක් ලෙස දැක්විය හැක. එමෙන්ම අමුද්‍රව්‍ය මිල අනපේක්ෂිත ලෙස විචලනය වීම මෙන්ම අමුද්‍රව්‍ය හිඟවීම වැනි හේතූන් මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවලට මුහුණදීමට සිදුවූ අවස්ථා මෙන්ම අක්මුදල් ලැබීමට ප්‍රමාදවීම් නිසා ව්‍යාපෘති බිල්පත් ගෙවන තුරු ව්‍යාපෘතියෙහි ඉදිරි ක්‍රියාකාරකම් ප්‍රමාද වීම ද දක්නට ලැබිණ.



නගරයේ අපද්‍රව්‍ය ජලය ගලා බසින කාණු පද්ධතිය ඉදිකිරීම (ii) අදියර - හම්බන්තොට



නගරයේ අපද්‍රව්‍ය ජලය ගලා බසින කාණු පද්ධතිය ඉදිකිරීම (ii) අදියර - කටුවන, වීරක්කුට්ටිගොඩ

4.3.2 ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම

ආපදා කළමනාකරණ විෂය සාමූහික ක්‍රියාදාමයක් වියයුතු අතර මේ සඳහා සියලු ක්ෂේත්‍රයන්හි දායකත්වය අත්‍යවශ්‍ය කාරණයක් වේ. ස්වභාවික සහ මිනිසා විසින් ඇතිකරනු ලබන ආපදා රටේ ඕනෑම ස්ථානයක සිදුවීමේ අවදානම පවතින බැවින් ජලය, ගොඩබිම සහ ගුවන යන සෑම ක්ෂේත්‍රයකම ක්‍රියාකාරකම් සමඟ ආපදා අවදානම් අවම කිරීම බද්ධ විය යුතුව ඇත. ප්‍රායෝගිකත්වය සලකා බලමින් සෘජුවම ආපදා අවදානම් කළමනාකරණය සඳහා දායක කරගතයුතු ක්ෂේත්‍ර 10ක් හඳුනාගෙන එම ක්ෂේත්‍ර තුළ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

මේ අනුව පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා වන ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මාර්ගෝපදේශ සැකසීම අවසන්කර ඇත.

1. ජාතික සැලසුම් සම්පාදන
2. නාගරික සංවර්ධන
3. ජාතික සහ පළාත් මහාමාර්ග ඉදිකිරීම් හා සංවර්ධන
4. පලාත් පාලන
5. සංචාරක
6. පුද්ගලික අංශය
7. සෞඛ්‍ය
8. ජල හා සනීපාරක්ෂාව
9. පාරිසරික බලපෑම් අධ්‍යන
10. දේශීය ආපදා කළමනාකරණ ක්‍රමෝපාය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් මෙම මාර්ගෝපදේශ මුද්‍රණය කර අදාළ ක්ෂේත්‍රවලට ලබාදීමට අපේක්ෂිත අතර එම මාර්ගෝපදේශ එක් එක් ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක කිරීම පහසුකරණය කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් සාමාජිකයන්ගේ මූලිකත්වයෙන් එම ක්ෂේත්‍රවලට අදාළ ආයතන තුළ ආපදා අවදානම් කළමනාකරණය අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ කමිටු සකස්කර එමඟින් උක්ත මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා උනන්දු කිරීමටත් මෙම වැඩසටහන පසුගමනීය කටයුතු සිදුකිරීමටත් අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන අභ්‍යන්තර විගණන කටයුත්තක් හේතුවෙන් නතරකර ඇති අතර ඉන් අනතුරුව ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

4.3.3 අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට ආපදා අවදානම් අවමකිරීම අන්තර්ග්‍රහණය කිරීම

ආපදා අවදානම් අවම කිරීම සමාජගත කිරීම සඳහා සුදුසුම මාධ්‍ය ලෙස පාසල් පද්ධතිය හඳුන්වාදිය හැකි අතර කුඩාකල සිට ආපදා අවදානම් කළමනාකරණය ළදරු මනස තුළ රෝපණය කිරීම තුළින් ආපදා අවදානම් අවමකිරීමේ චර්යාත්මක වෙනසක් මිනිස් සමාජය තුළ ස්ථාපනය කිරීමේ අවස්ථාව ඇත.

ආපදා අවදානම් අවමකිරීම ජීවිතයට පුරුද්දක් ලෙස එකතුවීම තුළින් රටේ සමස්ත ක්ෂේත්‍රයන් තුළ ආපදා අවදානම් අවම කිරීම ක්‍රියාත්මක කිරීම පහසුවනු ඇත. විවිධ ක්ෂේත්‍රයන් තුළ ආපදා අවදානම් අවම කිරීම අන්තර්ග්‍රහණය කිරීම සඳහා කටයුතු සිදුකෙරෙන අතරතුර උක්ත වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම තුළින් තිරසර ආපදා අවදානම් අවමකිරීමේ සංස්කෘතියක් නිරිමාණය කිරීම මෙහි දිගුකාලීන ඉලක්කය වනු ඇත.

ඒ අනුව පාසල් දරුවන් සඳහා මූලික ආපදා කළමනාකරණ මූලධර්ම පිළිබඳ දැනුවත් වෙමින් ආපදා අවදානම් තක්සේරුකරණය පාසල් මට්ටමින් සිදුකිරීම සඳහා සිංහල සහ දමිල මාධ්‍යයෙන් අත්පොත් නිර්මාණය කර මුද්‍රණය කර බෙදාහැරීම පසුගිය වර්ෂයන් තුළ සිදුකල අතර ඉංග්‍රීසි මාධ්‍යයෙන් අත්පොතක් නිර්මාණයකර පිටපත් 1000ක් මුද්‍රණය කිරීම මෙම වසර තුළදී සිදුකරන ලදී. මෙම පොත් ජාත්‍යන්තර පාසල් අතර බෙදාදීමට අපේක්ෂිතය.

4.3.4 ආපදා අවදානම් අවම කිරීම සඳහා ආයතනික වගකීම් හා කාර්යභාරයන් සහ ජනතාවගේ අයිතීන් පිළිබඳ ලියවිල්ලක් සැකසීම

උක්ත කරුණට අදාළව ආපදා අවදානම් අවම කිරීම සඳහා ප්‍රධාන වශයෙන් කටයුතු කරනු ලබන සහ කටයුතු කලයුතු ආයතන නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් මූලික වැඩමුළුවක් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද අතර මීට අදාළ මූලික ලියවිල්ල සකස්කර ඇත.



4.3.5 සමාකරන අභ්‍යාස සිදුකිරීම පිළිබඳ මාර්ගෝපදේශයක් සැකසීම

ව්‍යුහාත්මක නොවන ආපදා අවදානම අවම කිරීමේ ක්‍රියාකාරකම් ලෙස සමාකරන අභ්‍යාස සිදුකිරීම සඳහා මාර්ගෝපදේශයක් නිර්මාණය කිරීම සිදුකරන ලද අතර මෙම වසර තුළ එය මුද්‍රණය කිරීම අවසන් කරන ලදී.

4.3.6 සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීම

මීට අදාළව පාර්ශවකරුවන් 100 දෙනෙකුගෙන් සමන්විත වැඩමුළුවක් පවත්වන ලද අතර එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළ තාක්ෂණික කමිටු නිර්මාණය කරමින් සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීමට අදාළ ඉදිරි කටයුතු එහිදී සැලසුම් කරන ලදී.

4.3.7 ආපදා අවදානම් තක්සේරුව

රට තුළ සිදුවී ඇති ආපදා, කාලගුණ සහ දේශගුණික රටා, භූ විෂමතා, ආර්ථික සමාජීය සහ භෞතික පසුබිම, ආදී විවිධ වූ කරුණු පදනම් කරගනිමින් ආපදා අවදානම් තත්වයන් පිළිබඳ යම් පුරෝකථනයක් විද්‍යාත්මකව සිදුකිරීමේ හැකියාවක් පවතින අතර මේ සඳහා විවිධ වූ තාක්ෂණික ආයතන මගින් සිදුකරනු ලබන පරීක්ෂණ, වාර්තා ආදිය ද ඉවහල් වේ. එමෙන්ම ආපදා තත්වයක් ඇතිවුව හොත් එක් එක් ආපදාව අනුව ගොදුරුවිය හැකි ප්‍රදේශ, ආරක්ෂිත ස්ථාන ආදී විවිධ වූ තොරතුරු විධිමත්ව නවීන තාක්ෂණය භාවිතා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සිදුකරනු ලබන නිලධාරීන්ට පරිශීලනය කළහැකි පරිදි සැකසීම ද ඉතාමත් වැදගත් කාරණයක් වේ. එමෙන්ම ආපදා අවදානම් තක්සේරුවට අදාළ තොරතුරු මගින් ආපදා කළමනාකරණයට අදාළ විවිධ වූ තීරණවලට එලඹීම සහ වැඩසටහන් සැලසුම් කිරීම ද පහසුකරවනු ලැබේ.

2019 වර්ෂය අවසන් වන විට අවසන් කරන ලද ආපදා අවදානම් දර්ශකය මුද්‍රණය කර අදාළ ආයතන වෙත බෙදාහැරීම සහ දැනුවත් කිරීම් සිදුකිරීම 2020 වර්ෂය තුළ සිදුකිරීමට කටයුතු කරන ලදී. මෙම අවදානම් දර්ශකය වසරින් වසර යාවත්කාලීන කරමින් අවදානම් දර්ශකයේ විචලනයන් අධ්‍යන කලයුතු වන අතර ඒ සඳහා වන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

4.3.8 තෝරාගත් නගර 10ක් තුළ ආපදා අවදානම් තක්සේරුකරණය

තෝරාගත් නගර 10ක් තුළ (ගම්පහ, මීගමුව, මන්නාරම, කළුතර, කඩුවෙල, කොලොන්නාව, මොරටුව, වැල්වැටිතුරෙයි, පේදුරුතුඩුව සහ චාවකච්චේරි) ආපදා අවදානම් තක්සේරු කරණය සඳහා බිම් මට්ටමේ දත්ත ඒකරාශී කිරීම අවසන් කර ඇති අතර නගර 10ට අදාළ දත්ත පරිගණකගත කිරීම ද අවසන් කර ඇත. මීට අදාළ අවදානම් පැතිකඩ නිර්මාණය කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින අතර උවදුරු සිතියම්කරණය, පාත්‍රතාවය ගණනය කිරීම සහ අවදානම් ගණනය කිරීම අවසන්කර ඇත.

4.3.9 අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආපදා අවදානම් තක්සේරුකරණය සිදුකිරීම

ජාතික මට්ටමින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පාසල් ආපදා අවදානම් තක්සේරුවක් සිදුකිරීමේ අවශ්‍යතාවය අධ්‍යාපන ක්ෂේත්‍රය තුලින්ම අවස්ථා ගණනාවකදීම ඉස්මතු වූ අතර එය කාලීන අවශ්‍යතාවයක් ද විය. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ පාසල් සඳහා අවදානම් දර්ශකයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මූලික මැදිහත්වීම් සිදුකිරීමට මෙම අංශය කටයුතු කරන ලදී.

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මූලික සාකච්ඡා සිදුකිරීමෙන් අනතුරුව අධ්‍යාපන කලාප අධ්‍යක්ෂකවරුන් සහ විදුහල්පතිවරුන් දැනුවත්කර උක්ත අවදානම් දර්ශකය සැකසීම සඳහා දත්ත ඒකරාශී කිරීමට අදාළ පෝරම බෙදාහැරීම සිදුකර අවසන්කර ඇති අතර එම දත්ත එකතු කිරීම මේ වන විට සිදුකෙරෙමින් පවතී. මෙම දත්ත ඒකරාශී කිරීම අතරතුර එම දත්ත පරිගණකගත කිරීමද සිදුකෙරෙමින් පවතී. ඒ අනුව දිවයිනේ පාසල් 8000ක ප්‍රශ්නාවලි ආපදා කළමනාකරන මධ්‍යස්ථානය වෙත ලැබී ඇති අතර එයින් ප්‍රශ්නාවලි 3000ක දත්ත, අදාල දත්ත ගොනුව තුළට ඇතුළත් කර ඇත. දමිළ මාධ්‍යයෙන් සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලි දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේ කටයුතු දිස්ත්‍රික් නිලධාරීන්ගේ සහය සහිතව සිදුකෙරෙමින් පවතී. පාසල් තුළ ආපදා අවදානම අවමකිරීමට අදාළ තීන්දු තීරණ ගැනීමේදී මෙම මූලාශ්‍රය වැදගත් වන අතර ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ තාක්ෂණික ප්‍රවේශයන් සඳහා ද මහෝපකාරී වනු ඇත.

4.3.10 ආපදා අවදානම් අවම කිරීම සඳහා අධි අවදානම් සහිත ක්ෂේත්‍ර හඳුනාගනිමින් ආපදා අවදානම් තක්සේරු සිදුකිරීමේ වැඩසටහන

සෙන්දායි රාමුව අනුව වන ගෝලීය ක්‍රියාවලිය තුළ මෙන්ම දේශීයව ආපදා අවදානම් අවම කිරීම සඳහා වන උපාය මාර්ග සැලැස්ම අනුව ද වසර 2030 වනවිට ආපදාවන්ගෙන් සුරක්ෂිතවුත් තිරසර සංවර්ධන ඉලක්ක ලගාකර ගැනීම අරමුණු කරගත්තාවුත් ක්‍රියාවලියක අවශ්‍යතාවය අවධාරණය කර ඇත. ඒ අනුව ආපදා පාත්‍රතාවයට වැඩි සම්භාවිතාවක් පවතින ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින් එම ක්ෂේත්‍ර තුළ ආපදා අවදානම් අවමකිරීම සඳහා තාක්ෂණික ප්‍රවේශයක අවශ්‍යතාවය හඳුනාගන ඇත. මෙහිදී විවිධ අවශ්‍යතා සහිත දරුවන් ජීවත්වන විශේෂිත රැකවරණ මධ්‍යස්ථාන, ළමා නිවාස, වැඩිහිටි නිවාස පිලිබඳව සැලකීමේදී මොවුන් ආපදාවකට ගොදුරුවීමේ වැඩි හැකියාවක් ඇති පිරිසක් වන බැවින් මොවුන්ගේ ආපදා අවදානම තක්සේරු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතර එම තක්සේරුව අනුව ආපදා අවදානම් අවමකිරීමට අදාළ තීන්දු තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම පහසුවනු ඇත.

ඒ අනුව 2020 වර්ෂය තුළ උක්ත කණ්ඩායම් පිළිබඳ ජාතික මට්ටමින් ආපදා අවදානම් තක්සේරුවක් සිදුකිරීමට කටයුතු කරන ලද අතර ඒ සඳහා උක්ත ක්ෂේත්‍රවලට අදාළ ද්විතීක දත්ත ඒකරාශී කිරීමෙන් අනතුරුව ප්‍රශ්නාවලි නිර්මාණය කර දත්ත ඒකරාශී කිරීම ආරම්භ කරන ලදී.
මේ වන විට දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි නිලධාරීන් දැනුවත් කර ප්‍රශ්නාවලි බෙදාහැරීම, දත්ත ඒකරාශී කිරීම සහ දත්ත පරිගණකගත කිරීම අවසන්කර ඇත.

4.3.11 ආපදා අවදානම් තක්සේරුකරණය පිළිබඳ පාර්ශව ආයතන සමඟ අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැඩමුළුව

ආපදා අවදානම් අවම කිරීමට අදාළව කටයුතු කරනු ලබන ආයතන සහ ව්‍යාපෘති නියෝජිතයන් සමඟ අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැඩමුළුවක පවත්වන ලද අතර මෙහිදී එක් එක් ආයතන මගින් අවදානම් තක්සේරු කිරීම සඳහා භාවිත කරනු ලබන ක්‍රමවේද පිළිබඳ එකඟතාවයන්ට එළඹෙන ලදී.



4.3.12 ආපදාවන්ගේ අහිමිවීම් හා හානි පිලිබඳ තක්සේරුකරණය කිරීම

ආපදාවන්ගේ අහිමිවීම් හා හානි පිළිබඳ තක්සේරු කිරීමට අදාළ කටයුතු මෙම අංශය මගින් ඉටුකෙරෙන අතර ඒ සඳහා දත්ත යාවත්කාලීන කිරීමට ක්‍රමවේද නිර්මාණය කිරීම සඳහා හඳුනාගත් ක්ෂේත්‍රයන් ගේ ධාරිතාවය වර්ධනය කිරීම ද මේ යටතේ සිදුකරනු ලැබේ.
පාර්ශවකාර ආයතන නියෝජිතයින් සඳහා අහිමිවීම් හා හානි පිළිබඳ දත්ත පද්ධතිය හඳුන්වා දීම සහ මෙම දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුළත් කිරීම පිළිබඳ ප්‍රයෝගික පුහුණුකිරීමේ වැඩසටහනක් පැවැත්වූ අතර ඒ සඳහා ජාතික ජලසම්පාදන මණ්ඩලය, විදුලිබල මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නියෝජන කරමින් සිදුකර ඇත.

4.3.13 Desinventra දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව www.desinventra.lk_ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇත. මෙම දත්ත පද්ධතිය සක්‍රීයව යාවත්කාලීන වන අතර නව දත්ත මූලාශ්‍රයන් හඳුනාගනිමින් වඩාත් නිවැරදි දත්ත පද්ධතියක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු හඳුනාගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

4.3.14 riskinfo අවදානම් තොරතුරු වෙබ්අඩවිය (riskinfo web potal)

භූ අවකාශීය දත්ත (Geospatial Data) මෙම වෙබ්අඩවියට ඇතුළත් කිරීම (upload) මෙහිදී සිදුකරනු ලබයි. මෙම භූ අවකාශීය දත්ත දෙස් විදෙස් පර්යේෂකයින් විසින් භාවිතා කරනු ලබන අතර එමගින් ආපදා සිදුවන, සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ අධ්‍යනය කිරීම්, තීරණගැනීම් ඉදිරි සැලසුම් සැකසීම් සිදුකරනු ලබයි. 2021 වර්ෂයේ ප්‍රධාන මෝසම් දෙකට අදාල පෙර සූදානම් කටයුතු සදහා සිතියම් සැකසීම්ද සිදුකරන ලදී.

4.3.15 චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකර ආපදාවට පාත්‍රවූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම

ආපදා තත්වයන් හිදී ආපදාවට පෙර සහ පසු චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීම, ‘‘ඉන්ටනැෂනල් චාටර්’’ (International Charter) සහ ‘‘සෙන්ටින්ල් එශියා’’ (Sentiual Asia) මගින් සිදුකරනු ලබන අතර එමගින් ආපදාවට පාත්‍රවූ ප්‍රදේශය පිළිබඳ තොරතුරු අනාවරණය සිදුකරනු ලබයි.

4.3.16 දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

ආපදා අවම කිරීමට අදාලව මහජනතාව විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමුකරනු ලබන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම ද මෙම අංශය මගින් සිදුකරනු ලබන අතර යොමුකර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම තීරණය වනු ඇත.

4.3.17 වෙනත් ආයතන සමඟ සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

<u>JICA ව්‍යාපෘතිය</u>

කාලගුණික විපර්යාස හේතුවෙන් සිදුවන අවදානම් තත්ත්ව පාදක කරගනිමින් කැළණි ගඟ ද්‍රෝණිය තුළ පවතින අවදානම් අවමකිරීම සඳහා JICA ආයතනය සමඟ විශේෂිත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට එකඟතාවය ඇතිකරගනිමින් අදාළ ගිවිසුම්වලට එළඹ ඇති අතර මූලික තක්සේරු කිරීම් සිදුකර ඇති අතර පවතින ලෝක වසංගත තත්වය හේතුවෙන් ව්‍යාපෘතියෙහී අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීමේ ගැටළුවක් පවතී.



4.4 හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (Emergency Operations Division)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධානතම අංශයක් වන හදිසි මෙහෙයුම් අංශය, පැය 24x7 පුරා ක්‍රියාත්මක වේ. එමෙන් ම ආපදා තත්ත්වයන් වර්ධනය වන ආකාරයත්, ප්‍රතිචාර සිදුකල යුතු මට්ටමත් අඛණ්ඩව තක්සේරු කරමින් ප්‍රතිචාර දැක්වීම සිදු කරයි. ආපදාවන්ගෙන් සිදු විය හැකි බලපෑම තක්සේරු කර ඒ අනුව සිදුවිය හැකි ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය පිළිබඳ තීරණ ගැනීමත්, එමඟින් ඉදිරියේදී මුහුණදීමට සිදුවන ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමට කටයුතු සැලසුම් කර විවිධ පූර්ව දැනුම්දීමේ ක්‍රමවේද භාවිතා කරමින් ජනතාව හා අදාළ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීම හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සිදු කරයි.



හදිසි මෙහෙයුම් මැදිරිය

4.4.1 සිදු වූ ආපදා හා සිදුකරන ලද හදිසි මෙහෙයුම් - 2021

<u>ගංවතුර (2021 මෝසම් වර්ෂා සක්‍රිය වීම නිසා ඇති වූ වර්ෂාව හේතුවෙන් හටගත් ගංවතුර)</u>

2021 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ වාර්තා වුණු ජල ගැලීම් හේතු කොට ගෙන විපතට පත්වූ පුද්ගල සංඛ්‍යාව 728583ක් වන අතර මරණ 36කි. විපතට පත් වූ සම්පූර්ණ පවුල් සංඛ්‍යාව 196315ක් විය. දිස්ත්‍රික් ආපදා සම්බන්ධීකරණ ඒකක විසින් සහාය ඉල්ලා සිටි අවස්ථාවලදී හදිසි මෙහෙයුම් අංශය විසින් පොලිසිය සහ ත්‍රිවිධ හමුදා සහාය ඇතිව මුදවා ගැනීම්, ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ගමන් කරවීම සහ හදිසි අවස්ථා සහනාධාර මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය කරන ලදි.

විශේෂයෙන් 2021 වර්ෂයේ විශාල වශයෙන් වර්ෂාපතනයන් ඇති වූ අතර ඊසානදිග සහ නිරිතදිග මෝසම් කාල සීමාවන් තුළ අයහපත් කාලගුණික තත්ත්වයත් සමඟ ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් මඩකලපුව, පුත්තලම, ගාල්ල, කොළඹ, ගම්පහ, ත්‍රිකුණාමලය, කිළිනොච්චිය, මහනුවර, නුවර එළිය, අනුරාධපුරය, රත්නපුර, යාපනය සහ මන්නාරම යන දිස්ත්‍රික්ක වැඩි වශයෙන් පීඩාවට පත්වූ දිස්ත්‍රික්ක ලෙස සඳහන් කළ හැකිය.

වගුව 7.1: ගංවතුර නිසා පීඩාවට පත් පුද්ගල සහ පවුල් සංඛ්‍යා

වර්ෂය	**ගංවතුර නිසා පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව**	**ගංවතුර නිසා පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව**
2020	121,234	33,267
2021	728,583	196,315




<u>නායයෑම්</u>

මෙම වර්ෂයේ විශාල ලෙස නාය යෑම් වාර්තා නොවූ අතර මහනුවර, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර යන දිස්ත්‍රික්කවල පමණක් නාය යෑම් තත්ත්වයන් වාර්තා විය. නායයෑම් හේතුවෙන් පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව 1774ක් වන අතර, නිවාස හානි 3887ක් ද, විපතට පත් වූ පවුල් 457ක් ද, මරණ 31ක් ද වාර්තා වී ඇත.

වගුව 7.2: නායයෑම් නිසා පීඩාවට පත් වූ පුද්ගල සහ පවුල් සංඛ්‍යාව

වර්ෂය	නායයෑම් නිසා පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව	නායයෑම් නිසා පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව
2020	44	5
2021	1774	457




ප්‍රබල / දැඩි සුළං

දැඩි සුළං හේතුවෙන් ත්‍රිකුණාමලය, රත්නපුර, කළුතර, කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල පුද්ගලයන් 27267ක් සහ පවුල් 7058ක් විපතට පත් වූහ. එමෙන් ම ජීවිත හානි 8ක් ද, නිවාස හානි 3694ක් ද එම කාල වකවානුව තුළ වාර්තා විය.

මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, මාර්ග එලි පෙහෙලි කිරීම, සන්නිවේදන සහ විදුලිබල සැපයීම් ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ සහාය ඇතිව විපතට පත්වූවන්හට සහන ලබාදීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට හැකි විය.

වගුව 7.3: දැඩි සුළං නිසා පීඩාවට පත් වූ පුද්ගල සහ පවුල් සංඛ්‍යාව

වර්ෂය	දැඩි සුළං නිසා පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව	දැඩි සුළං නිසා පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව
2020	73,131	10,612
2021	27,267	7,058





කැළෑ ගිනි

මෙම වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලයේ දී ශ්‍රී ලංකාව තුළ කැළෑ ගිනි 101ක ප්‍රමාණයක් වාර්තා වූ අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතු කාර්යක්ෂම සන්නිවේදන ජාලය උපයෝගී කොට ගෙන කඩිනමින් යුදහමුදාව, ගුවන් හමුදාව සහ පොලිසිය ප්‍රාදේශීය ගිනි නිවන මධ්‍යස්ථානවල සහාය ලබා ගනිමින් ගිනි නිවාරණ කටයුතු සිදු කරන ලදී.

වගුව 7.4: කැළෑ ගිනි 2020 -2021

වර්ෂය	සිදු වූ කැළෑ ගිනි සංඛ්‍යාව
2020	284
2021	101

වගුව 7.5: ව්‍යසන මගින් ඇති වූ මරණ, බලපෑම් සහ අලාභ හානි පිළිබඳ

ආපදාව	මරණ සංඛ්‍යාව	තුවාල ලැබීම්	අතුරුදහන් වීම්	ආපදාවට ලක් වූ පවුල් සංඛ්‍යාව	ආපදාවට ලක් වූ පුද්ගල සංඛ්‍යාව	අර්ධ නිවාස හානි	පූර්ණ නිවාස හානි
කන්ඩි කඩා වැටීම්	8	10		1122	4210	521	30
සුළි කුණාටු				1	3	1	
නියඟය				2190	8915		
පිපිරීම්	1	1		2	12		
ගොඩනැඟිලි ගිනි ගැනීම්	7	11		113	494	58	69
හදිසි ගංවතුර				1578	6102	89	
ගංවතුර	36	6	1	196315	728583	3791	96
කැළෑගිනි							
නාය යෑම්	31	13	0	457	1774	299	11
දැඩි සුළං	8	24	3	7058	27267	3961	58
මුළු එකතුව	**91**	**65**	**4**	**208836**	**777360**	**8720**	**264**

Source – www.dmc.lk (desinventar)

4.4.2 X-press Pearl නෞකාවෙහි ඇති වූ ගින්න මැඩපැවැත්වීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දායකත්වය

එක්ස්ප්‍රස් පර්ල් (X-press Pearl) නෞකාවේ ඇති වූ ගින්න ශ්‍රී ලංකාවට සිදු වූ දරුණුතම සමුද්‍ර ව්‍යසනයයි. එය ශ්‍රී ලංකාවේ සංවේදී වෙරළබඩ පරිසරයට, ප්‍රාදේශීය ප්‍රජාවන්ට සහ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇත.

2021.05.20 වන දින පැය 1600ට මෙම සිද්ධිය පිළිබඳව සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත තොරතුරු ලැබුණු අතර සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිල වට්ස් ඇප් (WhatsApp) සමාජ ජාල සමූහය හරහා සියලුම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිලධාරීන් දැනුවත් කරන ලදී. ජාතික තෙල් කාන්දුවීම් පිළිබඳ හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය පියවර ගන්නා ලදී. IMT WhatsApp සමාජ ජාල සමූහය හරහා තෙල් / අන්තරායකර සහ හානිකර අපද්‍රව්‍ය (Hazardous and Noxious Substances) කාන්දු වුවහොත් ඒ පිළිබඳ ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ අදාළ සියලුම පාර්ශවකරුවන් දැනුවත් විය. සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙතින් නැව් අනතුරට ලක් වූ ස්ථානය පිළිබඳ තොරතුරු ලබාගෙන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙ හි හදිසි මෙහෙයුම් අංශය සමඟ යාවත්කාලීන කිරීම් ලබා දීම සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ලබා ගත හැකි තොරතුරු, යෝජනා බෙදා ගැනීමට සහ ගත යුතු ඉදිරි පියවර සාකච්ඡා කිරීමට රැස්වීම් ද

සංවිධානය කරන ලදී. කෙසේ වෙතත්, පරිසර අමාත්‍යාංශය සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය (NARA) සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) සමඟ එක්ව පරිසරයට වන හානිය අවම කර ගැනීමට හැකියාව ලැබුණි.




රසායනික හා රසායනික නොවන අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳ ආ.ක.මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතළු නිලධාරීන් කොළඹ සිට මීගමුව දක්වා වෙරළ තීරයේ ක්ෂේත්‍ර චාරිකාව

4.4.3 හදිසි මෙහෙයුම් අංශය මගින් සිදු කරනු ලබන අනෙකුත් කාර්යයන්

- **දෛනික තත්ත්ව වාර්තා පිළියෙල කිරීම**

  දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවලින් විධිමත් වූ ආකෘති භාවිතා කර ලබා ගන්නා තොරතුරු අනුව ජාතික මට්ටමින් දෛනික තත්ත්ව වාර්තා දිනකට තුන් වතාවක් යාවත්කාලීන කර අන්තර්ජාලය වෙත යොමු කරනු ලබයි. එසේම එම තත්ත්ව වාර්තා ජනාධිපති ලේකම් කාර්යයාලය, අගමැති ලේකම් කාර්යයාලය හා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ද ෆැක්ස් මගින් යොමු කරනු ලබයි.

- **ආපදා පෙරහුරු වැඩසටහන් සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම**

  සුනාමි, ජල ගැලීම් හා නායයෑම් පෙරහුරු වැඩසටහන් විවිධ මට්ටමින් සිදු කරනු ලබන අතර වාර්ෂිකව සුනාමි පෙරහුරු වැඩසටහන අන්තර්ජාතික හා කලාපීය මට්ටමින් සිදු කරනු ලබන අතර ඊට අවශ්‍ය තාක්ෂණික සහය හදිසි මෙහෙයුම් මැදිරිය තුළින් ලබා දෙනු ලබයි.

- **හදිසි මෙහෙයුම් මැදිරියේ දැනුවත් කිරීමේ වැඩසටහන්**

  දේශීය / විදේශීය ශිෂ්‍ය කණ්ඩායම්, ආරක්ෂක අංශයන්හි නිලධාරීන්, පාර්ශවකරුවන්, රාජ්‍ය නිලධාරීන් ආදී කණ්ඩායම් සඳහා හදිසි මෙහෙයුම් ක්‍රියාවලිය, පූර්ව දැනුම් දීම් යාන්ත්‍රණය, ආපදා අවදානම් කළමනාකරණය ආදී විෂයයන් පිළිබඳව වීඩියෝ සම්මන්ත්‍රණ සහ හදිසි මෙහෙයුම් මැදිරිය යොදා ගනිමින් කරන ලද දැනුවත් කිරීම් සිදු කරන ලදී.

4.4.4 2021 වර්ෂය තුළ හදිසි මෙහෙයුම් අංශය මඟින් සිදු කරනු ලැබූ ව්‍යාපෘති

හදිසි මෙහෙයුම් මැදිරිය නවීකරණය කිරීමේ සහ 117 ඇමතුම් මැදිරිය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, හදිසි මෙහෙයුම් මැදිරිය පුළුල් කිරීම සහ විද්‍යුත් පැනල් සවි කිරීම, විදුලි පද්ධතිය නවීකරණ

කිරීම සහ කබඩ් සවි කිරීම මඟින් මේ වන විට නව පෙනුමක් හදිසි මෙහෙයුම් මැදිරියට ලැබී ඇත. එමෙන් ම හදිසි මෙහෙයුම් මැදිරිය සහ 117 ඇමතුම් මැදිරිය ඉදිරිපස නිල් වර්ණයෙන් යුත් තීන්ත ආලේප කොට නාම පුවරු සහ ස්ටිකර් සවි කිරීම මඟින් වර්ණවත් පෙනුමක් සහ සිත්ගන්නා සුළු පෙනුමක් ලැබී ඇත.



නවීකරණයෙන් පසු හදිසි මෙහෙයුම් මැදිරිය

4.4.5 දිස්ත්‍රික් හදිසි මෙහෙයුම් මැදිරි නවීකරණය කිරීම


ආපදා කළමනාකරණ සහ පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමේ අරමුණින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයන්හි හදිසි මෙහෙයුම් මැදිරි ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ එක් අදියරක් යටතේ තෝරා ගත් දිස්ත්‍රික් ඒකකයන් 14ක් සඳහා හදිසි මෙහෙයුම් මැදිරි ස්ථාපනය සිදු කරන ලදී. ඒ සඳහා සෑම දිස්ත්‍රික්කයකම හදිසි මෙහෙයුම් මැදිරිය බෙදා වෙන් කිරීම (Partition) සහ හදිසි මෙහෙයුම් මැදිරිය කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා උපකරණ මිලදී ගනිමින් එම දිස්ත්‍රික් ඒකකයන්වල හදිසි මෙහෙයුම් මැදිරි ස්ථාපනය 2021 දෙසැම්බර් 31 දින වන විට සියළු කටයුතු නිම කර අවසන් කරන ලදී. මෙම සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 5,486,374.38 මුදලක් වැය කරන ලදි. එම දිස්ත්‍රික් 14 සඳහා වියදම් වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන්ව පහත දක්වා ඇත.

වගුව 7.6: දිස්ත්‍රික් හදිසි මෙහෙයුම් මැදිරි නවීකරණය කිරීම සඳහා වෙන් වූ මුදල් ප්‍රමාණයන්

අනු අංකය	දිස්ත්‍රික්කය	වියදම් වූ මුදල (රු)
1	කිළිනොච්චිය	143,421.70
2	මහනුවර	584,574.75
3	යාපනය	299,063.93
4	කොළඹ	496,761.13
5	අනුරාධපුර	191,909.44
6	රත්නපුරය	433,301.24
7	මන්නාරම	322,047.37

8	ත්‍රිකුණාමලය	201,275.00
9	කුරුණෑගල	463,770.00
10	පුත්තලම	998,351.72
11	වව්නියාව	154,989.72
12	බදුල්ල	422,350.00
13	ගාල්ල	213,558.38
14	නුවර එළිය	561,000.00
එකතුව		**5,486,374.38**

4.4.6 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම



පූර්ව අනතුරු ඇඟවීම්, ප්‍රතිචාර සහ සම්බන්ධීකරණය සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ පාර්ශවකරුවන්ගේ වගකීම පිළිබිඹු කරනු ලබන ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම මඟින් එක් එක් ආයතනයන්ගේ වගකීම සහ නියම කරන ලද කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටි මෙහි අන්තර්ගත කර ඇත. මෙම ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සඳහා 2017 අගෝස්තු මස කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එතැන් පටන් මෙය වසර 5ක කාලයක් සඳහා ක්‍රියාත්මක කළ හැකිය. එලෙස අනුමැතිය ලද ජාතික හදිසි මෙහෙයුම් සැලැස්මේ පිටපත් 650ක් ලෝක ආහාර සංවිධානය (WFP) ආධාර ඇතිව මුද්‍රණය කර පහත සඳහන් ආයතන හා ආයතන ප්‍රධානීන් වෙත බෙදා දීමට කටයුතු කරන ලදී.

- ආණ්ඩුකාරවරුන්
- පළාත් පාලන කොමසාරිස්වරුන්
- අමාත්‍යාංශ ලේකම්වරුන්
- දිස්ත්‍රික් ලේකම්වරුන්
- ප්‍රාදේශීය ලේකම්වරුන්
- ජාතික මට්ටමේ සියළුම පාර්ශවකාර ආයතන
- ත්‍රිවිධ හමුදා සෙවීම් සහ මුදවා ගැනීමේ ඒකක

4.4.7 සෙවුම් සහ මුදවා ගැනීමේ පාඨමාලා 5ක් පැවැත්වීම

ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) මූල්‍ය දායකත්වයෙන් අන්තර් ජාතික සෙවුම් සහ මුදවා ගැනීම් සාමූහිකත්වයේ (INSARAG) තාක්ෂණික දායකත්වයෙන් සෙවුම් සහ මුදවා ගැනීම් (SAR General)

පාඨමාලාව සහ සෙවුම් සහ මුදවා ගැනීම් ක්‍රමවේදය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම (TOT) යන පාඨමාලාවන් දෙක අදියර දෙකක් යටතේ ස්ථාන 3ක දී පවත්වන ලදී. මෙම සම්පූර්ණ පාඨමාලා 5 සඳහා රුපියල් මිලියන 4,248,818.80 වියදම් වූ අතර ඒ සඳහා නිලධාරීන් 197 දෙනෙකු සහභාගී විය.

- ගම්පොළ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානයෙහි 2021 සැප්තැම්බර් 13 සිට 17 දක්වා පුහුණුකරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව (TOT) පවත්වන ලදී. 2021 සැප්තැම්බර් 21 සිට 25 සෙවුම් සහ මුදවා ගැනීම් (SAR General) පාඨමාලාව පවත්වන ලදී.
- ගඟේවාඩිය, ශ්‍රී ලංකා නාවික හමුදා ආපදා කළමනාකරණ පුහුණු පාසලෙහි 2021 සැප්තැම්බර් 13 සිට 17 දක්වා පළමු අදියර ද සැප්තැම්බර් 21 සිට 25 දක්වා දෙවන අදියර ද වශයෙන් සෙවුම් සහ මුදවා ගැනීම් (SAR General) පාඨමාලාව පවත්වන ලදී.
- මුලතිව් පිහිටි ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයෙහි 2021 සැප්තැම්බර් 13 සිට 17 දක්වා සෙවුම් සහ මුදවා ගැනීම් (SAR General) පාඨමාලාව පවත්වන ලදී.

එම පාඨමාලාවන්ගේ සමූහ ඡායාරූප කිහිපයක් සහ එම පාඨමාලාවන් පැවැත්වූ ආකාරය දැක්වෙන ඡායාරූප කිහිපයක් පහතින් දක්වා ඇත.






4.4.8 2021 වර්ෂයේදී හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා මිලදී ගත් උපකරණ

හදිසි ආපදා අවස්ථාවලදී බලපෑමට ලක් වන ප්‍රජාව සෙවීම් හා මුදවා ගැනීම් සඳහා අවශ්‍ය උපකරණ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් වාර්ෂිකව මිලදී ගෙන ඒවා පළමු ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් වන යුධ හමුදා , නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිසිය වෙත ලබා දී ඔවුන්ගේ ධාරිතා වර්ධනයට දායකත්ව ලබා දෙයි. 2021 වාර්ෂයේදී වෙන් කරන ලද රුපියල් මිලියන 50ක ප්‍රතිපාදන මඟින් පහත දැක්වෙන හදිසි ප්‍රතිචාර දැක්වීමේ උපකරණ මිලදී ගන්නා ලදී.

වගුව 7.7: 2021 වර්ෂයේදී හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා මිලදී ගත් උපකරණ

අනු අංකය	වර්ගය	ප්‍රමාණය	වටිනාකම (රු)
1	බෝට්ටු ඇන්ජින්	36	20,071,800.00
2	විදුලි ජනක යන්ත්‍ර	20	1,350,000.00
3	මුදවා ගැනීම් සඳහා භාවිත කරන ජලය මත පාවෙන ටියුබ්	52	689,611.52
4	ගම් බූට්ස්	665	1,138,606.35
5	මුදවා ගැනීම් සඳහා භාවිතා වන විසි කිරීමේ බෑගය	508	1,498,600.00
6	සෙවීම් පන්දම්	122	879,604.61
7	විදුලි ජනක යන්ත්‍ර කිලෝ බයිට් 62.5	1	3,362,000.00
8	කොන්ක්‍රීට් කපන තල	10	2,059,579.9
9	විදුලි කියත්	35	4,102,524.65
10	මිට සහිත උදළු	261	508,950.00
11	මිට සහිත පොරව	300	435,000.00
12	මන්නා කැති	200	292,000.00

13	ගලවා ගැනිමේ කඹය	17	1,468,800.00
14	අත් වැසුම්	32	69,690.24
15	වයර් කපනය	9	242,312.31
16	මුදවා ගැනීම සඳහා භාවිත කරන බඳපටිය	1	29,965.68
17	කකුල් හිරකරනය	2	29,489.4
18	ස්පයිනල් බෝට්ස්	2	110,000.00
19	ඩී හැඩැති කැරබිනියුර් මුදු	3	39,722.4
20	ගම් බූට්ස්	332	568,447.08
21	මුදවා ගැනීම සඳහා භාවිතා කරන විසි කිරීමේ බෑගය	254	749,300.00
22	කොන්ක්‍රීට් කපන තල	3	617,873.97
23	අඟුල්	8	1,768,000.00
24	හඬකරයන්	55	1,208,350.00
			43,290,228.11

4.4.9 පූර්ව දැනුම්දීම්

දිස්ත්‍රික් ඒකකවල සහ ග්‍රාමීය මට්ටමේ ප්‍රජාවන් තුළ පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරය කිරීමේ හැකියාව ශක්තිමත් කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ඉහළම ප්‍රමුඛතාවය ලබා දී ඇත. මේ වන විට දිවයිනේ බොහෝ ප්‍රදේශ ආවරණය වන පරිදි පූර්ව දැනුම් දීමේ පද්ධතිය ව්‍යාප්ත කොට ඇත. තවද HF/VHF ක්‍රමවේදය හරහා බිම් මට්ටම දක්වා සන්නිවේදන කටයුතු විකාශනය කිරීම සඳහා අලුත්වැඩියා කිරීම් කටයුතු සිදු කරමින් පවතී. පූර්ව දැනුවත් කිරීමේ කුළුණු යාන්ත්‍රිකව ක්‍රියා කරවීම සඳහා ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් පුහුණු කිරීම සිදු කර හදිසි ආවස්ථාවලදී ක්‍රියාත්මක කිරීමට පහසු වන පරිදි සකසන ලදී.

- ඍතුවියේ සිදු වන භූමි කම්පා පිළිබඳව නිරීක්ෂණය හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
  ඉන්දු ඕස්ට්‍රේලියානු භූ කාරක තැටියේ පමණක් නොව ඍතුවියට අයත් සියළුම භූ කාරක තැටි තුල හටගන්නා භූමි කම්පා පිළිබඳ තොරතුරු **USGS** මගින් ලබා ගෙන එම තොරතුරු මත හා අවශ්‍යතාවය අනුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා පතල් හා කැණීම් කාර්යයාංශය (**GSMB**) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් එම ආයතන වල තාක්ෂණික තොරතුරු අනුව සැලකිය යුතු මට්ටමින් භූමි කම්පා ඇති වූ විට ඒවා පිළිබඳ අදාළ දිස්ත්‍රික්කයන්හි ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දැනුවත් කිරීම හා අවශ්‍ය මග පෙන්වීම සිදු කර සුනාමි ඇති වීමට ඇති ඉඩකඩ පිළිබඳව දැනුවත් කිරීම සිදු කරනු ලබයි.

- පූර්ව දැනුම් දීම් හා තොරතුරු යාවත්කාලීන කිරීමේ කටයුතු වෙනුවෙන් සියළු මාධ්‍ය දැනුවත් කිරීම සහ පැය 24 පුරා අඛණ්ඩ මාධ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම, සියළු මාධ්‍ය හරහා පූර්ව දැනුම් දීම් සිදු කිරීම හා අඛණ්ඩව ඒම තොරතුරු යාවත්කාලීන කිරීම සහ සියළු මාධ්‍ය තුළ පවතින SMS සහ අනෙකුත් පතුරුවා හැරීමේ ක්‍රමවේදයන් හදිසි මෙහෙයුම් මැදිරිය සමඟ සම්බන්ධ කරයි. ඒ හරහා විශාල ග්‍රාහක ප්‍රමාණයකට SMS ලබා දීම, සමාජ වෙබ් අඩවි යාවත්කාලීන කිරීම සහ දත්ත පද්ධතීන් යාවත්කාලීන කිරීම පැය 24 පුරා සිදු කරනු ලබයි.

- සියළුම ප්‍රාදේශීය මාධ්‍ය වාර්තාකරුවන් අපගේ පූර්ව දැනුම්දීමේ පද්ධතිය සමඟ සම්බන්ධ කරන ලදී.
- හදිසි ආපදා තත්ත්වයකදී හෝ ඊට පෙර සියළු ආපදා කටයුතු වෙනුවෙන් පූර්ව දැනුම් දීම් තොරතුරු යාවත්කාලීන කිරීම 24 x 7 පුරා සිදු කරනු ලබයි.
- ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය සතු VHF/HF/UHF සන්නිවේදන ජාලයන් හරහා ජනතාවට පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදය නිරන්තර යාවත්කාලීන කිරීම කරනු ලබන අතර ඒ හරහා බිම් මට්ටමේ ජනතාව ඉතා කෙටි කාලයකින් දැනුවත් කිරීම සිදු කරනු ලබයි.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තොරතුරු නිලධාරියා හරහා (Information Officer) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත තොරතුරු දැන ගැනීමේ පනතට ප්‍රකාරව ලැබෙන සියලු ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වන ලදී.
- පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණුවල නඩත්තු කටයුතු මනාව පවත්වාගෙන යාම, දෛනික පරීක්ෂා කිරීම් කටයුතු සහ අධීක්ෂණ කටයුතු සිදු කරන ලදී.
- DEWN පද්ධතියේ ග්‍රාහකයන් ප්‍රමාණය 27,000 දක්වා වැඩි කිරීමට කටයුතු කළ අතර නව DEWN පද්ධතිය හඳුන්වා දීම සහ නිලධාරීන් ඒ පිළිබඳ පුහුණු කිරීම සිදු කරන ලදී.
- හදිසි මෙහෙයුම් මැදිරිය පුළුල් කිරීමත් සමඟ සියලු ස්වයංක්‍රීය පද්ධතීන් (USGS, Ventusky , Windy, Automated Rain Gauges Systems-NBRO, MET & Irrigation, Online Reservoirs System, Online River Status System, PRISM, Local and International TV channels) යාවත්කාලීන කිරීම සහ සම්බන්ධ කිරීමේ කටයුතු සිදු කිරීම.
- **MOBILIZE** දත්ත පද්ධතිය හදිසි මෙහෙයුම් මැදිරිය තුළ ස්ථාපිත කොට හදිසි අවස්ථාන්හිදී සිතියම් ඇතුළු සජීවී පරිමාණයන් ගැනීමට කටයුතු සිදු කරන ලදී.

4.4.10 ඇමතුම් මැදිරිය

<u>117 ඇමතුම් මැදිරියේ දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම</u>

මෙමඟින් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරීවරුන්, සහන සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් ගේ දුරකථන අංක යාවත්කාලීන කිරීම සහ ගංවතුර සහ නායයෑම්වලින් බලපෑමට ලක් වන දිස්ත්‍රික්ක, ආපදාවට අදාලව ප්‍රතිචාර දක්වන තාක්ෂණික

ආයතනවල සියළු නිලධාරීන්ගේ දුරකථන අංක ක්ෂණිකව ලබා ගත හැකි ආකාරයට දත්ත ගබඩාවක් සකස් කරන ලදී. COVID 19 වසංගත තත්ත්වය හමුවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙමින් අදාල අංශ දැනුවත් කිරීම් සහ ජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීමට කටයුතු කරන ලදී. නව පරිගණක පද්ධති 5ක් සහ නවීන ජාල පද්ධතියක් 117 ඇමතුම් මැදිරිය තුළ ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදී. මේ හරහා ඉතා කාර්යක්ෂමව මෙම ඇමතුම් ක්‍රමවේදය පවත්වා ගැනීමට කටයුතු සලසා දෙන ලදී. 2021 වර්ෂය තුළ COVID 19 සම්බන්ධ දුරකතන ඇමතුම් 1736 ද සම්පූර්ණ ඇමතුම් 295112 ද ඇමතුම් මැදිරිය වෙත ලැබී ඇත.

4.4.11 ත්‍රිවිධ හමුදා සහ පොලිසිය සම්බන්ධීකරණ කටයුතු

දිවයින පුරා ඇතිවන ඕනෑම ආපදා තත්ත්වයක් සඳහා නිරන්තරයෙන් ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය විසින් සෙවීම් හා මුදවා ගැනීම් කටයුතු සහ හදිසි ප්‍රතිචාර දැක්වීමේ කටයුතු ඉතාමත් සාර්ථකව සිදුකරන ලදී. මෙම මධ්‍යස්ථානයෙහි සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ නිලධාරියකු යටතේ ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් අනුයුක්ත කර ඇත. මෙහිදී හදිසි මෙහෙයුම් මැදිරියෙහි පැය 24 පුරාවට ත්‍රිවිධ හමුදා සහ පොලිස් හට පිරිස් රාජකාරී කරනු ලබන අතර මෙතෙක් සිදුවූ ආපදා තත්ත්වයන්වලදී ත්‍රිවිධ හමුදා මාණ්ඩලික ප්‍රධානී කාර්යයාලය සමඟ සම්බන්ධීකරණය වී ඉතාමත් කෙටි කාලයක් තුළදී අවශ්‍ය ස්ථානයන් කරා මුදවා ගැනීමේ සහ සහන සැලසීමේ හට පිරිස් යොමු කිරීමට සෑම විටම ක්‍රියාකරන ලදී.

ඉහත සඳහන් ආකාරයට 2021 වසරේ ඇතිවූ ගංවතුර, නාය යෑම්, කැලෑ ගිනි සහ සාමාන්‍ය ගිනි ඇතුළුව සියලුම ආපදාවන්වලදී ද මෝසම් වර්ෂාවන් නිසා අපිරිසිදු වූ පානීය ජල ළිං සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු සඳහා ද, ත්‍රිවිධ හමුදා මුදවා ගැනීමේ සහ සහන සේවා කණ්ඩායම්වල සේවය ලබා දෙන ලදී.

<u>අභියෝග</u>

- ආපදා කළමනාකරණ පනත මඟින් පනවන ලද ව්‍යවස්ථාදායක රාමුවට අනුව සහ ජාතික ව්‍යසන කළමනාකරණ සභාව සහ ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝගය යටතේ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ශක්තිමත් විය යුතුය.
- ආපදා අවදානම් කළමනාකරණය සඳහා සිරස් හා තිරස් සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම හා පහසුකම් සැපයීම.
- ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට ඇතුළත් කිරීම.
- පළාත් පාලන අංශයන් ආපදා කළමනාකරණය සඳහා දිස්ත්‍රික් මට්ටමින් ආපදා කළමනාකරණ ඒකක සමඟ සක්‍රීයව ආපදා අවස්ථාවලදී සම්බන්ධ නොවීම.
- කඩිනම් පුනුරුත්ථාපන සහ යථා තත්වයට පත් කිරීම සඳහා හදිසි මූල්‍යමය ප්‍රතිපාදනයක් නොමැති වීම.
- ආපදා කළමනාකරණ අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කිරීම.
- බහු උපද්‍රව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සහ සංවර්ධනය කිරීම.

- පවත්නා සන්නිවේදන ජාලය අළුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම.
- ජාතික ආපදා හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සහ දිස්ත්‍රික් හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
- ජාතික ආපදා කළමනාකරණ උපාය මාර්ගයන්ට අනුව සෙවීම් හා ගලවා ගැනීමේ කණ්ඩායම් දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපනය කර නොමැති වීම.
- හදිසි ප්‍රතිචාර දැක්වීමේදී සෙවීම් හා ගලවා ගැනීමේ කණ්ඩායම් සඳහා අවශ්‍ය හදිසි මූල්‍යමය ප්‍රතිපාදනයන් වෙනුවෙන් හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා වූ හදිසි අරමුදලක් (Emergency Fund) නොමැති වීම.
- දැනට පවත්නා සන්නිවේදන ජාලය සහ පෙර දැනුම් දීමේ ක්‍රියාවලිය සඳහා ස්ථාපිත ක්‍රමවේදයන් තුළින් බහු උපද්‍රව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයක් නොමැති වීම.
- හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ඇති සම්පත් ප්‍රතිඵලදායී ලෙස හදිසි ප්‍රතිචාර සඳහා යොදා ගැනීමට නිසි ක්‍රමවේදයක් නොමැති වීම.
- රාත්‍රී කාලයේදී ආපදාවන් සිදුවුවහොත් හදිසි ප්‍රතිචාර දැක්වීමට හෙලියානාවල සහයෝගය ලබා ගැනීමට හැකියාවක් නොමැති වීම.

4.5 මූල්‍ය අංශය

4.5.1 මූල්‍ය ප්‍රගතිය (2021 දෙසැම්බර් මස 31 වන දිනට)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා, 2021 වසර වෙනුවෙන්, රු.මි. 782.3ක සමස්ත ප්‍රතිපාදනයක්, වාර්ෂික අයවැය මගින් වෙන්කර තිබේ. එම සමස්ත ප්‍රතිපාදනවලින්, රු.මි.300ක් පුනරාවර්තන වියදම් සඳහා වෙන්ව තිබූ අතර, ඉන් රු.මි. 260ක්, ආයතනයේ අත්‍යවශ්‍ය මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා වැය කරන ලදි. එමෙන්ම, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්වූ රු.මි.482.3ක ප්‍රතිපාදනවලින්, රු.මි.234.3ක් ද පහත සඳහන් පරිදි වැය කර තිබේ.

වගුව 8.1: මූල්‍ය ප්‍රගතිය (2021 දෙසැම්බර් මස 31 දිනට)

වැය විෂය අංකය	**වැය විෂය/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම**	**මුළු ප්‍රතිපාදන (රු.මිලියන)**	**වියදම (රු.මිලියන)**	**මූල්‍ය ප්‍රගති %**	**භෞතික ප්‍රගති %**
409-2-9-1-1503,1509	**පුනරාවර්තන වියදම්**	**300**	**260**	**87**	**87**
	ප්‍රාග්ධන වියදම්				
409-2-9-1-2201 (i)	සේවක පුහුණු, හැකියා හා ධාරිතා වර්ධනය	1.0	0.3	30	30
409-2-9-1-2201 (ii)	ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපනය සහ පුනරුත්ථාපනය	8.0	6.08	76	80
409-2-9-1-2401(13)	CBRN ආපදා තත්වයන්ට ප්‍රතිචාර සඳහා සෙවීම් හා මුදවාගනීම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ධාරිතාව ඉහල නැංවීමේ වැඩසටහන	5.3	5.3	100	100
409-2-9-2-2509	දිස්ත්‍රික්කවල ආපදාවන්හි බලපෑම් අවමකිරීමට ආපදා වැළැක්වීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	350	156.16	45	65
409-2-9-3-2509 (i)	ආපදා පෙරසුදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත්කිරීම් - දැනුවත්කිරීම් අංශය	25	9.44	38	38
409-2-9-3-2509 (ii)	ආපදා පෙරසුදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත්කිරීම් - පෙරසූදානම අංශය	25	6.25	25	25
409-2-9-4-2509	ශ්‍රී ලංකාව සඳහා බහු උපද්‍රව අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම	10	0.2	20	40
409-2-9-5-2103	නායයෑම්, ගංවතුර හා නියඟ අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ධාරිතා වර්ධනය	50	48.87	98	100
409-2-9-6-2509	ආපදා හානි අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහයට අන්තර්ගතකිරීම	8	1.66	21	40
	ප්‍රාග්ධන වියදම්වල එකතුව	**482.3**	**234.3**	**49**	**63**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2021 දෙසැම්බර්31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන්	2021 රු. '000	2020 රු. '000
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල්වලට සමාන දෑ	3	10	10,257
තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ	4	3,130	9,502
පෙරගෙවුම් සහ අත්තිකාරම්	5	1,731	2,067
භාණ්ඩ තොග	6	5,466	6,468
ආපදා ප්‍රතිචාර උපරකණ තොග	7	46,701	18,672
අස්පෘශ්‍ය වත්කම් සහ කරමින් තිබෙන වැඩ		174	174
		57,212	**47,140**
ජංගම නොවන වත්කම්			
අස්පෘශ්‍ය වත්කම්	8	12,291	10,200
දේපල, පිරියත සහ උපකරණ	9	594,173	738,613
මුළු ජංගම නොවන වත්කම්		**606,464**	**748,813**
මුළු වත්කම්		**663,676**	**795,953**
වගකීම්			
ජංගම වගකීම්			
වෙනත් වෙන්කිරීම්	10	206	206
වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	11	18,938	10,233
		19,144	**10,439**
ජංගම නොවන වගකීම්		24,338	47,970
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	12	8,882	16,244
වෙනත් සංවිධානවලින් ආධාර	13	33,160	64,214
මුළු ජංගම නොවන වගකීම්		52,304	74,653
ශුද්ධ වත්කම්		**611,372**	**721,300**
සමකොටස්/අරමුදල් සහ සංචිත			
අරමුදල් සහ සංචිත			
සමුච්චිත අරමුදල		(1,061,801)	(1,016,508)
ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන			**(53,651)**
වත්කම් ප්‍රාග්ධන ආධාර - ICET ව්‍යාපෘතිය		281,900	400,186
මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ආධාර		1,184,837	1,184,837
සංචිත ප්‍රත්‍යාගණනය - වාහන		206,436	206,436
මුළු සම කොටස් / අරමුදල් සහ සංචිත		**611,372**	**721,300**

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත්කිරීම සම්බන්ධයෙන් අන්තර්කාලීන කළමනාකරණ කමිටුව වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන අන්තර්කාලීන කළමනාකරණ කමිටුව විසින් අනුමත කර ඇති අතර ඒ වෙනුවෙන් පහත සඳහන් අය අත්සන් කර තිබේ.

නිශාන්ත අබේසිංහ අධ්‍යක්ෂ -මුදල්	මේජර් ජෙනරල් සුදන්ත රණසිංහ (විශ්‍රාමික) අධ්‍යක්ෂ ජනරාල්	එච්. යූ. ආර්. ෆොන්සේකා/ ප්‍රධාන ගණකාධිකාරි අයි. එම්. සී සාමාජික	ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික) අයි. එම්.සී සභාපති, අමාත්‍යාංශ ලේකම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා කාර්යය සාධන ප්‍රකාශනය

	සටහන	**2021** රු. **'000**	**2020** නැවත සඳහන් කරන ලද රු. **'000**	**2020** විගණනය කරන ලද රු. **'000**
වර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයේ ප්‍රදාන	15	241,905	244,979	244,979
වෙනත් ආදායම්	16	149,789	149,180	149,180
මුළු ආදායම		**391,694**	**394,159**	**394,159**
පරිපාලන වියදම්	17	(426,103)	(450,164)	(450,164)
වෙනත් වියදම්	18	(11,315)	(10,715)	(10,715)
මෙහෙයුම්වලින් අතිරික්තය (හිඟය)		**(45,724)**	**(66,720)**	**(66,720)**
ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයේ ප්‍රදාන	18.1	242,955	106,455	-
වසරේ ප්‍රාග්ධන වියදම්	14	(196,420)	(53,651)	-
ප්‍රාග්ධන වියදමින් පසු අතිරික්තය/ (හිඟය)		**811**	**(13,916)**	**(66,720)**
වෙනත් විස්තීරණ වියදම්				
ලාභය හෝ පාඩුවට අනුව නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්				
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වලින් තථ්‍ය ලාභය (පාඩුව)	12.1	7,184		
මුළු විස්තීරණ ආදායම		**7,995**	**(13,916)**	**(66,720)**

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

	ප්‍රාග්ධන ප්‍රදාන අක්මුදල්	වත්කම් ප්‍රදාන භාණ්ඩාගාරය	වත්කම් ප්‍රධාන ICET – ව්‍යාපෘතිය	ප්‍රත්‍යාගණනය මෝටර් රථ	සමුච්චිත අරමුදල	ශුද්ධ වත්කම් මුළු එකතුව
	රු. '000	**රු. '000**	**රු. '000**	**රු. '000**	**රු. '000**	**රු '000**
2020 ජනවාරි 1 දිනට ශේෂය	**324,449**	**957**	**520,490**	**206,436**	**(207,095)**	**845,237**
පෙර වර්ෂයේ ගැලපීම්	-	-	-	-	11,240	11,240
වසරේ ක්‍රමක්ෂය	-	(957)	(120,303)	-	-	(121,260)
වසර තුළ ලැබුණ ප්‍රාග්ධන ප්‍රදාන	106,454	-	-	-	-	106,454
වසරේ ලැබුණ ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	(53,651)	-	-	-	-	(53,651)
වසරේ මෙහෙයුම්වලින් අතිරික්තය (හිඟය)	-	-	-	-	(66,720)	(66,720)
2020 දෙසැම්බර් 31 ට ශේෂය	**377,253**	**-**	**400,187**	**206,436**	**(262,575)**	**721,300**
2021ජනවාරි 01 ට ශේෂය	**377,253**	**-**	**400,187**	**206,436**	**(262,575)**	**721,300**
පෙර වර්ෂයේ ගැලපීම්					364	364
වසරේ ක්‍රමක්ෂය	-		(118,287)			(118,287)
වසර තුළ ලැබුණ ප්‍රාග්ධන ප්‍රදාන	242,955					242,955
වසරේ ලැබුණ ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	(196,420)					(196,420)
වසරේ මෙහෙයුම්වලින් අතිරික්තය (හිඟය)					(45,724)	(45,724)
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත තථ්‍ය ලාභය					7,184	7,184
2021දෙසැම්බර් 31 ට ශේෂය	**423,788**	**-**	**281,900**	**206,436**	**(300,751)**	**611,372**

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරන මධ්‍යස්ථානය
31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2021	**2020**
	රු. '000	**රු. '000**
පෙර බදු අතිරික්තය (හිඟය)	**(45,724)**	**(66,720)**
ගැලපීම්		
ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය	167,027	164,771
වත්කම් ප්‍රාග්ධන ප්‍රදානයන්හි ක්‍රමක්ෂය	(118,287)	(121,260)
පාරිතෝෂික ගෙවීම්	(1,997)	(269)
වෙනත් ආදායම් ලෙස සැලකූ මුදල් නොවන ප්‍රදාන ලැබීම්	-	(3,638)
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	(14,450)	8,929
වත්කම් බැහැර කිරීම මත ලාභය	(135)	(11)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය (හිඟය)	**(13,566)**	**(18,198)**
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම්		
කාර්ය මණ්ඩල ගංවතුර සහ නායයාම් සැප්. ණය වැඩිවීම්/ (අඩුවීම්)	-	90
තැන්පත් සහ වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම්/ (අඩුවීම්)	6,372	(7,492)
භාණ්ඩ තොග වැඩිවීම්/ (අඩුවීම්)	1,002	4,046
ආපදා ප්‍රතිචාර උපකරණ තොග වැඩිවීම්/ (අඩුවීම්)	(28,029)	(9,693)
පෙර ගෙවුම් සහ අත්තිකාරම් වැඩිවීම්/ (අඩුවීම්)	336	1,708
වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම්/ (අඩුවීම්)	8,705	(41,442)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**(25,180)**	**(70,981)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහයන්		
දේපළ, පිරියත සහ උපකරණ (දේ.පි.උ.) අත්පත්කරගැනීම්	(14,226)	(6,680)
වත්කම් ප්‍රදාන	(10,468)	(174)
(දේ.පි.උ.) බැහැර කිරීම මත අලෙවි ආදායම	151	11
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**(24,543)**	**(6,843)**
මූල්‍ය කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහ		
ප්‍රාග්ධන ප්‍රදාන ශුද්ධ වැඩිවීම් (ලැබීම්)	242,955	106,455
ප්‍රාග්ධන ප්‍රදාන ශුද්ධ වැඩිවීම් (ගෙවීම්)	(196,420)	(53,651)
රා.නො.ස./ අ.රා.නො.ස. වලින් ශුද්ධ ප්‍රදාන	(7,422)	1,819
පෙර වසර – මුදල් ලැබීම්	363	-
මූල්‍යකරණයෙන් වත්කම් ප්‍රදාන	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**39,476**	**54,623**
මූල්‍ය සහ මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වෙනස්කම්	(10,247)	(23,201)
වසර ආරම්භයේ මුදල් සහ මුදල්වලට සමාන දෑ	10,257	33,458
වසර අවසානයේ මුදල් සහ මුදල්වලට සමාන දෑ (සටහන අ)	**10**	**10,257**
සටහන අ - මුදල් සහ මුදල්වලට සමාන දෑ	**Rs. '000**	**Rs. '000**
බැංකුවේ ඇති මුදල්	10	10,257
අතැති මුදල්		-
මුළු එකතුව	**10**	**10,257**

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

අයවැය සහ සත්‍ය / තත්‍ය වියදම් සැසඳුම් ප්‍රකාශය 2021

ප්‍රාග්ධන වියදම්

විස්තරය	ඇස්තමේන්තුව 2021 (සංශෝධිත)	තථ්‍ය වියදම	අතිරික්තය / (විචලනයන්)	එකහවූ ඉතිරිකිරීම්
ආපදා කළමනාකරණ මධයස්ථානය – කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය	1.5	0.3	1.2	1
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය – වත්කම් අත්පත්කර ගැනීම	7.5	6.1	1.4	0.8
දිස්ත්‍රික්ක වල අවදානම අඩුකිරීම සඳහා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	350	156.16	193.84	72
CBRN හදිසි තත්ත්වයන් සඳහා SAR ධාරිතාව වර්ධනය කිරීම.	5.3	5.3	-	-
ගං වතුර සහ නායයෑම් ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණයේ ධාරිතාව ශක්තිමත් කිරීම.	50	48.87	1.13	-
ආපදා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.	25	9.44	15.56	-
ආපදා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව සූදානම් කිරීම.	25	6.25	18.75	2
ශ්‍රී ලංකාව සඳහා බහු ආපදා අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම.	10	0.2	9.8	8.7
ආපදා අවදානම අවම කිරීම ප්‍රධාන ප්‍රවාහයට අන්තර්ග්‍රහණය කිරීම.	8	1.66	6.34	6.4
එකතුව	**482.3**	**234.28**	**248.02**	**90.9**

වර්තන වියදම

විස්තරය	ඇස්තමේන්තුව 2021 (සංශෝධිත)	තථය වියදම	අතිරික්තය / (විචලනයන්)
පුද්ගල වැටුප්	205	194	11
ප්‍රවාහන වියදම්	8.9	5.8	3.1
සැපයුම් **	19.8	14.3	5.5
නඩත්තු වියදම්	25.3	15.9	9.4
කොන්ත්‍රාත් සේවා	35	26.5	8.5
වෙනත්	6	6.5	(0.5)
එකතුව	**300**	**263**	**37**

**අභිතකර විචලනයන් උපචිත වර්තන වියදම් හේතුවෙනි.

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

අයවැය සහ සැබෑ වියදම් සැසඳුම් ප්‍රකාශය 2021

වර්තන වියදම් **Rs. 000'**

විස්තරය	ඇස්තමේන්තු 2021 (සංශෝධිත)	තත්‍ය වියදම	අතිරික්තය / (විචලනයන්)
පුද්ගල පඩිනඩි			
වැටුප් සහ වේතන	156,000	147,505	8,495
අතිකාල	15,400	15,038	362
වෙනත් දීමනා	33,600	31,213	2,387
	205,000	**193,756**	**11,244**
ප්‍රවාහන සහ යැපුම්			
දේශීය ගමන්	8,400	5,678	2,722
විදේශීය ගමන්	500	148	352
	8,900	**5,826**	**3,074**
සැපයුම්			
ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන භාණ්ඩ	9,000	5,060	3,940
ඉන්ධන සහ ලිහිසි තෙල්	10,800	9,217	1,583
	19,800	**14,277**	**5,523**
නඩත්තු			
මෝටර් වාහන නඩත්තුව	13,200	5,959	7,241
දේපළ, පිරියත, කාර්යාල උපකරණ, ගෘහ භාණ්ඩ සහ වෙනත් නඩත්තුව	12,100	9,940	2,160
	25,300	**15,899**	**9,401**
සේවා			
ප්‍රවාහන	200	85	115
විදුලිය සහ ජලය	18,000	15,420	2,580
තැපැල් සහ විදුලි සන්දේශ	15,600	9,651	5,949
කුළී සහ බදු	1,200	1,153	47
වෙනත් (ආරක්ෂක , සනීපාරක්ෂක සේවා ආදිය) **	6,000	6,585	(585)
එකතුව	**41,000**	**32,894**	**8,106**

** අභිතකර විචලනයන් උපචිත වර්තන වියදම් හේතුවෙනි..

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු තොරතුරු

1.1 නෛතික ස්වරූපය සහ පිහිටුවීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යනු, ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා 2005 අංක 13 දරණ ආපදා කළමනාකරණ පනත යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය විද්‍යා මාවත, කොළඹ 7 හි පිහිටා තිබේ.

ආපදා කළමනාකරණ ජාතික සභාව පිහිටුවීම සඳහා පනතින් ප්‍රතිපාදන සැලසෙන අතර ශ්‍රී ලංකාව තුළ ආපදා අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ ජාතික සභාවට සහාය දීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවයි. අමාත්‍යාංශයේ ලේකම් ගේ සභාපතිත්වයෙන් යුතුව ආයතනයේ මනා ක්‍රියාකාරිත්වය අරමුණු කරගෙන අන්තර්කාලීන කළමනාකරණ කමිටුව පිහිටුවා තිබේ. වර්තමානයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

පනතේ (1) උප කොටස යටතේ දක්වා තිබෙන මධ්‍යස්ථානයේ කාර්යයන් සභාව විසින් නියම කරනු ලැබිය යුතු අතර ඒවා පහත පරිදි වේ.

- ජාතික ආපදා කළමනාකරණ සැළසුම සහ ජාතික හදිසි මෙහෙයුම් සැළැස්ම සකස් කිරීමේ දී සභාවට සහාය ලබා දීම සහ එය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල යෝජනා ලබා දීම.
- ජාතික ආපදා කළමනාකරණ සැළසුම සහ ජාතික හදිසි මෙහෙයුම් සැළැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දැරීම සහ ආපදා තත්ත්වයක් ප්‍රකාශ කළඅවස්ථාවක ජාතික හදිසි මෙහෙයුම් සැළැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
- අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථා විසින් සකස් කරන විවිධ ආපදා කළමනාකරණ සැළසුම් ජාතික ආපදා කළමනාකරණ සැලසුමට අනුගත කිරීම.
- පනතේ 10 වගන්තිය යටතේ විවිධ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා විසින් සකස් කරන ආපදා කළමනාකරණ සැලසුම් පදනම් කරගෙන ආපදා සූදානම, අවම කිරීම, වැළැක්වීම, සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතුවලට සැලසුම් සහ වැඩසටහන් සකස් කිරීම සහ එවන් වැඩසටහන් සහ සැලසුම් ක්‍රියාත්මක කරන සංවිධාන සම්බන්ධීකරණය කිරීම එවන් ක්‍රියාකාරකම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මූල්‍ය ආධාර ලබා ගැනීම සහ එම මූල්‍ය ආධාර අදාළ ප්‍රදේශවලට නිදහස් කිරීම සහ එම ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම.
- යෝග්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ආපදා කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් සඳහා උපදෙස් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ එම සංවිධාන සහ ලේකම් වරුන් සමඟ සහයෝගයෙන් වැඩ සටහන් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- ආපදා කළමනාකරණයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ආපදා කළමනාකරණය පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම සහ නඩත්තු කිරීම.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.3 ප්‍රධාන මෙහෙයුම් ස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය විද්‍යා මාවත, කොළඹ 7 හි පිහිටා ඇති අතර සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක 25ක් පිහිටුවා තිබේ.

1.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබෙන්නේ ආයතනය අඛණ්ඩ පැවැත්මක් සහිත එකක් බව උපකල්පනය කරමින් ය. නුදුරු අනාගතය තුළ ආයතනයට අඛණ්ඩ පැවැත්මක් සහිතව කටයුතු කිරීමට ඇති හැකියාව පිළිබඳ කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් කර තිබේ. තවදුරටත් අඛණ්ඩ පැවැත්මක් සහිතව ඉදිරියට යාමට ආයතනය තුළ ඇති හැකියාව සැළකිය යුතු අවිනිශ්චිත තත්ත්වයක් ඇතිකරන ද්‍රව්‍යාත්මක අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත් වී නැති අතර ආයතනයේ මෙහෙයුම් නතර කිරීමට හෝ ආයතනය ඈවර කිරීමට හෝ ඔවුන්ගේ අදහසක් නොමැත. එමනිසා මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්මක් තිබේ යන පදනම මත ක්‍රියාත්මක වේ.

1.5 මූල්‍ය කාලසීමාව

නියෝජනය කරන ආයතනයේ මූල්‍ය කාල සීමාව 2021 ජනවාරි 1 සිට 2021දෙසැම්බර් 31 දක්වා මාස 12 ක කාලයක් සඳහා වේ.

1.6 මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ පදනම

1.6.1 අනුකූල වීමේ ප්‍රකාශය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් ඉදිරිපත් කර තිබෙන වෙනත් ගිණුම්කරන ප්‍රමිතීන්ට ද අනුකූල වන ලෙස සකස් කර තිබේ.

මෙම මූල්‍ය ප්‍රකාශවල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශ, ශුද්ධ වත්කම්/ හිමිකම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශ, මූල්‍ය ප්‍රවාහ සහ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් පිළිබඳ ප්‍රකාශ ආදිය ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී යොදාගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා තිබේ. වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්තේ නම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති අවසන් ප්‍රකාශවල ඉදිරිපත් කර තිබෙන සියලු කාලවලට අදාළ වේ.

1.6.2 මිනුම්වල පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධ යෝග්‍ය හෙළි කිරීම් කර ඇති අවස්ථාවල හැර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම උපචිත පදනම අනුව සකස් කර තිබෙන අතර ඓතිහාසික වියදම් පදනම මත සිදු කර තිබේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.6.3 සන්සන්දනාත්මක තොරතුරු

සන්සන්දනාත්මකබව වැඩි කිරීම සඳහා සහ වර්තමාන කාලය සඳහා වන මූල්‍ය ප්‍රකාශයන් වටහා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා සන්සන්දනාත්මක තොරතුරුවලට පසුගිය කාලයේ මූල්‍ය ප්‍රකාශයේ වාර්තා වූ සියළු ප්‍රමාණයන් සඳහා ප්‍රමාණාත්මක, ආඛ්‍යානාත්මක සහ විස්තරාත්මක තොරතුරු ඇතුළත් වේ.

1.6.4 ප්‍රමාණාත්මක බව සහ සමාහරණය

සමාන අයිතමයන් සහිත සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම දක්වා තිබේ. වෙනස් ස්වාභාවයේ අයිතමයන් හෝ කටයුතු ඒවා ප්‍රමාණාත්මක නොවන අවස්ථාවල හැර වෙනම ඉදිරිපත් කර තිබේ.

1.6.5 වගකීම සහ මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්වාර කළමනාකරණ කමිටුව මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම පිළිගන්නා අතර 2022 පෙබරවාරි 24 දින පැවැත්වූ රැස්වීමේ දී කාරක සභාව විසින් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

1.6.6 ශ්‍රිතයාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශ ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ ආයතනයේ ශ්‍රිතයාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර තිබෙන සියළු මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති අවස්ථාවල ආසන්න රු. 1000 ට සකස් කර තිබේ.

1.7 වැදගත් ගිණුම්කරණ තක්සේරු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සූදානම් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල ගිණුම්කරණ ප්‍රතිපත්තියට බලපාන විනිශ්චයන්, තක්සේරු සහ උපකල්පනයන් සිදු කිරීමට අවශ්‍ය වේ. ඇත්ත ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය.

<u>නිශ්චිත ප්‍රතිලාභ සැළසුම්</u>

සේවකයන්ගේ පශ්චාත් රැකියා නියුක්ති ප්‍රතිලාභ සැළසුම තීරණය කිරීම ප්‍රොජෙක්ට් යුනිට ක්‍රෙඩිට් ක්‍රමය උපයෝගී කරගෙන තීරණය කරයි. මෙම ක්‍රමය තුළ පොළී අනුපාත, වැටුප් වැඩිවීමේ අනුපාත සහ විශ්‍රාම යන වයස සඳහා උපකල්පන භාවිතා කිරීම මත සිදු කරයි. සැළසුමේ දිගු කාලීන ස්වාභාවය අනුව මෙම ඇස්තමේන්තු සැළකිය යුතු අවිනිශ්චිතතාවක පවතියි.

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්ගේ වෙනස්කම්

ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ ඕනෑම වෙනස්කමක් මූල්‍ය ප්‍රකාශවල අදාළ සටහන්වල හෙළි කර තිබේ.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය.

2.1 වත්කම් සහ එහි තක්සේරුවේ පදනම

2.1.1 දේපළ, පිරියත සහ උපකරණ

1. හඳුනාගැනීමේ සහ ඇගයීමේ පදනම

දේපල පිරියත සහ උපකරණ හඳුනාගන්නේ එම වත්කම්වලට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ලැබෙන බවත් වත්කම්වල වියදම විශ්වසනීය ලෙස ගණනය කළ හැකි බවත් යන සම්භාවිතාව මතය.

සියළුම දේපල, පිරියත සහ උපකරණ මූලිකව වියදම අනුව සඳහන් කරන අතර ක්‍රමයෙන් වියදම අඩු කළ සමුච්චිත ක්ෂය වීම අනුව සහ හානි අලාභ අනුව ගණනය කරයි. අලුත්වැඩියා සහ නඩත්තු වියදම විස්තීරණ අදායම් ප්‍රකාශය තුළ හඳුනාගන්නා අතර යම් අවස්ථාවන් සහ වෙනස්කම් සිදුවීම තුළ ධාරණ අගය නැවත ලබාගත නොහැකි විය හැකි බවට දැක්වෙන අවස්ථාවල දේපළ පිරියත සහ උපකරණවල ධාරණ අගය හානි සඳහා සමාලෝචනය කරනු ලබයි.

2. ක්ෂය වීම්

වත්කම්වල ඵලදායී ජීවන කාලය මත එම ප්‍රමාණයන් කපා හැරීම සඳහා සියළු දේපළ පිරියත සහ උපකරණවල වියදම මත සරළ රේඛීය ක්‍රමය භාවිතා කරමින් ක්ෂය වීම් ගණනය කරනු ලබයි. වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවන කාලය පහත පරිදි වේ.

වත්කම් කාණ්ඩය	ඵලදායී ජීවන කාලය (වසර)
ත්‍රිවිධ හමුදා නවාතැන් ගොඩනැගිලි	20
ගෘහ භාණ්ඩ සහ උපාංග	10
සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	20
විදුලි සන්දේශ උපකරණ	5 -20
මෝටර් වාහන	5-10
පරිගණක	10
කාර්යාල උපකරණ	10
පුස්තකාල පොත්	10

ඕනෑම වත්කමක ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත් වහාම වන අතර අලෙවිය සඳහා වත්කම වර්ගීකරණය කරන ලද මුල් දින සිට වත්කම බැහැර කරන කාලය දක්වා වේ. දේපල පිරියත සහ උපකරණවල සැළකිය යුතු අයිතමයන් විවිධ ඵලදායී ජීවන කාලයන් සහිතව වෙන් වෙන්ව හඳුනාගනෙ ක්ෂය වීම් සිදු කර තිබේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3. ඉවත් කිරීම

යම්කිසි දේපල, පිරියත සහ උපකරණයක් ඒවායින් කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් එය භාවිතාවෙන් හෝ බැහැර කිරීමෙන් බලාපොරොත්තු නොවන විට ඒවා බැහැර කිරීම මත ඉවත් කරනු ලබයි. යම්කිසි වත්කමක් ඉවත් කිරීම මත මතුවන ලබා ගැනීමක් හෝ හානියක් ශුද්ධ බැහැර කිරීමේ ක්‍රියාවලිය සහ ධාරණ වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරන අතර වසර සඳහා වන විස්තීරණ අදායම තුළ වත්කම ඉවත් කළ බව සඳහන් කරනු ලබයි.

2.1.2 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ලැබෙන බවටත් එම වත්කමේ අහිමි වීම විශ්වසනීය ලෙස ගණනය කළ හැකි බවටත් වන සම්භාවිතාව මතය. ආයතනය විසින් ලබා ගන්නා අස්පෘශ්‍ය වත්කම් ගණනය කරනු ලබන්නේ සමුච්චිත ක්‍රමක්ෂ වියදම අඩු කිරීම සහ සමුච්චිත හානි අලාභ අඩු කිරීමෙනි.

2.1.3 භාණ්ඩ තොග

යල් පැනගිය සහ මන්දගාමී අයිතමයන් නිසි දීමානා ලබාදීමෙන් පසුව ශුද්ධ උපලභ්‍ය අගය සහ වටිනාකමේ පහළ අගය මත භාණ්ඩ ලේඛණ සකස් කර තිබේ. ශුද්ධ උපලභ්‍ය අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ඇස්තමේන්තුගත විකුණුම්ව ටිනාකමින් සම්පූර්ණ ඇස්තමේන්තුගත වියදම සහ විකුණුම් වියදම් අඩු කිරීමෙන් ලැබෙන අගයයි. භාණ්ඩ ලේඛණවල වියදම පදනම් වන්නේ මිලදී ගැනුම් අගයයි. වියදමට භාණ්ඩ ලේඛණ ලබා ගැනීමේදී දරන වියදම සහ ඒවා තිබෙන ස්ථානවලට ගෙන ඒමට සහ එම තත්ත්වයන්ට පත් කිරීමට යන වියදම ඇතුළත් වේ. ආයතනයේ භාණ්ඩ ලේඛණවලට ආපදා ප්‍රතිචාර උපකරණ, දැනුවත් කිරීමේ පොත්, පත්‍රිකා, ටෝනර්, කාට්රිජ්, ලිපි ද්‍රව්‍ය සහ වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය අඩංගු වේ.

2.1.4 තැන්පතු සහ ලැබිය යුතු දෑ

තැන්පතු සහ ලැබිය යුතු දෑ ඒවා ආරම්භ වූ දිනයේ සිට හඳුනාගනු ලැබේ. තැන්පතු සහ ලැබිය යුතු දේවලට සේවක අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

2.1.5 මුදල් සහ මුදල්වලට සමාන දෑ

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල්වලට සමාන දෑ යන්නට අතැති මුදල් සහ බැංකු ශේෂයේ ඇති මුදල් මධ්‍යස්ථානය විසින් සළකනු ලැබේ.

2.1.6 වගකීම් සහ වෙන්කිරීම්

වගකීමක් සේවා අරමුණක් සහිතව සමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ බේරුම්කිරීම අපේක්ෂා කරන විට ජංගම දෙයක් ලෙස වර්ගීකරණය කරන අතර වාර්තා කරන කාළ සීමාවෙන් පසු එය මාස දොළහක කාලයක් තුල බේරුම් කළ යුතු අතර වාර්තා කිරීමේ කාලයනේ පසු එම වගකීම බේරුම් කිරීම අවම වශයෙන් මාස දොළහකට ප්‍රමාද කිරීම සඳහා කොන්දේසි විරහිත අයිතියක් නොමැත. අනෙකුත් සියළු වත්කම් ආයතනය විසින් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර තිබේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.7 වෙන්කිරීම්

යම් කිසි පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ආයතනයට නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඇති විට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයන් හඳුනා ගන්නා අතර වත්කම් ගලායාමක් එම වගකීම බේරුම් කිරීම සඳහා අවශ්‍ය වන අතර එම වගකීම විශ්වසනීය ලෙස ගණනය කළ හැකිය.

2.1.8 සේවක ප්‍රතිලාභ

1. **සේවක ප්‍රතිලාභ සැලසුම – පාරිතෝෂික**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම යනු, නිශ්චිත දායකත්ව සැලසුමකට වඩා පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුමක් වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම ගණනය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUC) භාවිතා කරමින් ස්වාධීන ආයුගණකයක් මගිනි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කරමින් තීරණය කරන අතර ඒ සඳහා ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකයන්හි සඳහන් වන පොළී අනුපාත භාවිතා කරන අතර එයට අදාළ කල් පිරීමට ආසන්න වගකීමට අදාළ කොන්දේසි ඇතුළත් වේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය සාධක කිහිපයක් මත තීරණය වන අතර ඒවා වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක සහ මරණ අනුපාතය වැනි උපකල්පන රාශියක් භාවිතා කරමින් ආයුගණක පදනම මත ගණනය කරයි. මෙම සැලසුම්වල දිගුකාලීන ස්වාභාවය නිසා එවන් ඇස්තමේන්තු සැළකිය යුතු අවිනිශ්චිතතාවන්ට භාජනය වේ. සියළු උපකල්පන එක් එක් වාර්තා කරන දිනයන්ට අනුව සමාලෝචනය කරනු ලැබේ. ඒ අනුව සේවක ප්‍රතිලාභ වගකීම් 2021 දෙසැම්බර් 31 දිනට වන ආයුගණක තක්සේරුව මත පදනම් වේ. පාරිතෝෂික සඳහා වන මධ්‍යස්ථානයේ ගිණුම්කරන ප්‍රතිපත්තිය වන්නේ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එය පූර්ණ වශයෙන් ඇතිවූ කාලය තුළ ආයුගණක ලාභ හා පාඩු ලෙස හඳුනාගැනීම යි.

2. නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුව සේවකයෝ සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායකත්වය දීම සඳහා සුදුසුකම් ලබති. මෙය ඇතිවන අවස්ථාවේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගනියි. මධ්‍යස්ථානය සේවකයන්ගේ දළ පඩිනඩි වශයෙන් පිළිවෙළින් 12% ක් සහ 3% ක් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායකත්වය සපයයි.

2.1.9 විදේශ මුදල් ගනුදෙනු පරිවර්තනය

ශ්‍රී ලංකා රුපියල් නොවන මුදල්වලින් සිදුකරන ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම එම ගනුදෙනුව සිදු කරන දිනයට ඇති වටිනාකමට සිදු කරනු ලැබේ.

.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.10 අරමුදල්, ප්‍රදාන සහ සංචිත ලැබීම සහ උපයෝජනය සඳහා වන ගිණුම්කරණය

විශේෂිත වූ සංවර්ධන ක්‍රියාකාරකම් සහ වැඩසටහන් සඳහා මධ්‍යස්ථානයට විවිධ ප්‍රදාන ලැබෙන අතර ලැබුණ සහ උපයෝජනය කළ අරමුදල් වසරේ ආදායම් සහ වියදම් ලෙස එය හඳුනාගෙන තිබේ.

2.1.11 මෝටර් වාහන ප්‍රත්‍යාගණනය

මෝටර් වාහන ප්‍රත්‍යාගණනය 2018 පෙබරවාරි 21 දින සිදුකරන ලද අතර කොළඹ මෙට්‍රෝ කළාපයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින එය සිදු කරන ලදී. එම අවස්ථාවේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව තිබූ මෝටර් වාහන මුළු වත්කම ප්‍රත්‍යාගණනය කරන ලදී. එමගින් ඇස්තමේන්තුගත වටිනාකමෙහි ධාරණ අගය රු. මිලියන 206.4 කින් වැඩි වූ අතර එම ත්කසේරු වටිනාකම ප්‍රාග්ධන සංචිත යටතේ ප්‍රත්‍යාගණන සංචිත ලෙස වාර්තා කරන ලදී. තව දුරටත් එම අගය මූළය තත්ත්ව ප්‍රකාශයේ සහ හිමිකම් වෙනස්වීමේ දී වෙනම දක්වා තිබේ.

2.1.12 වත්කම් සහ ආදායම්වලට අදාළ ප්‍රදාන ඉදිරිපත් කිරීම්

1. මහා භාණ්ඩාගාරයෙන් ලැබුණ වත්කම්වලට අදාළ ප්‍රදාන

වත්කම්වලට අදාළ ක්ෂය වීම්වලට අදාළ ප්‍රතිකර්ම ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 අනුව වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්‍රමානුකූල සහ තාර්කික පදනමකින් ආදායමක් ලෙස හඳුනාගත් විලම්භිත ආදායමක් ලෙස කටයුතු කර තිබේ.

2. ආදායමට අදාළ ප්‍රදාන

අදායමට අදාළ ප්‍රදාන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ණයක් ලෙස ඉදිරිපත් කර තිබෙන අතර විකල්පයක් ලෙස අනෙකුත් ඒවා අදාළ වියදම් වාර්තා කිරීමේ දී අඩු කරයි.

රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලින් ලැබුණ දායකත්වයන් සහ ආධාර ලැබුණ අවස්ථාවේ යොමු කිරීම් අනුදේශ නොමැති විට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

අතිරික්ත අරමුදල්, අදාළ අධාර ගිවිසුම් හෝ ආධාර දුන් තැනැත්තාගේ අනුමැතිය සහිතව වෙනත් සංවිධානවලින් ලැබුණ ආධාරවලින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ.

උපයෝජනය නොකළ අරමුදල් ඒවායේ අදාළ අරමුදල් ගිණුම්වල රඳවා තබන අතර ඒවා අවශ්‍ය වන අවස්ථාව දක්වා මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ වෙනත් සංවිධානවලින් ලැබුණ ආධාර යටතේ ඇතුළත් කරනු ලැබේ.

අනුමත ආධාර වියදම් ලැබුණ ආදායම අභිබවන විට සහ ඉතුරු මුදල අනිවාර්යයෙන්ම ලැබෙන අවස්ථාවක එවන් මුදල් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ලැබිය යුතු දෑ ලෙස හඳුනාගනු ලැබේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3. අරමුදල් / 2021 වසරේ අග්‍රිම ලැබීම්

